# ප්‍රගති වාර්තාව 2013
# முன்னேற்ற அறிக்கை 2013
# Progress Report 2013

## සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
## சிவில் விமானசேவை அமைச்சு
## Ministry of Civil Aviation

# පටුන - பொருளடக்கம் - Contents


- සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය 01
- සිවිල් ගුවන්සේවා අධිකාරිය 09
- ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා ) සමාගම 16
- ශ්‍රී ලන්කන් ගුවන්සේවා සමාගම 26
- මිහින් ලංකා පෞද්ගලික සමාගම 30
- නාවික හා ගුවන්සේවා තොරතුරු සහ පර්යේෂණ ආයතනය 33
- சிவில் விமானசேவை அமைச்சு 41
- சிவில் விமானசேவை அதிகாரசபை 50
- விமானநிலைய மற்றும் விமானசேவைக் (சிறிலங்கா) கம்பனி 60
- சிறிலங்கன் விமானசேவைக் கம்பனி 71
- மிகின்லங்கா தனியார் கம்பனி 75
- கப்பல் , விமானசேவை தகவல்கள் மற்றும் ஆராய்ச்சி நிறுவனம் 78
- Ministry of Civil Aviation 87
- Civil Aviation Authority 95
- Airport & Aviation Services (SL) Ltd 104
- Sri Lankan Airlines Ltd 114
- Mihin Lanka (PVT) Ltd 118
- Shipping & Aviation Information and Research Institute 121

# සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

**දැක්ම**

“ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ වඩාත් මිත්‍රශීලී සහ තරගකාරී ගුවන් කේන්ද්‍රස්ථානය ලෙස වැඩි දියුණු කිරීම”

**මෙහෙවර**

“ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස තරගකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක ගුවන්සේවාවන් සැලසීමට ඉවහල් වන වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති රටාවක් පිළියෙල කිරීම හා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසීම”

**අරමුණු**

- ගුවන්සේවා කටයුතු සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම, සමායෝජනය, අධීක්ෂණය හා පසුවිපරම.
- ජාත්‍යන්තර තත්ත්වයට අනුකූල වන ලෙස සුරක්ෂිත බව සහ ආරක්ෂාව තහවුරු කරන තරගකාරී ගුවන්සේවා පහසුකම් පවත්වාගෙන යාම.
- ගුවන් මගී සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහන කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- අභ්‍යන්තර ගුවන්සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ජාත්‍යන්තර ගුවන්සේවා සාකච්ඡාවන් විවිධ රාජ්‍යයන්ගේ ගුවන් සංතරණ අධිකාරීන් සමඟ පැවැත්වීම.
- ගුවන්සේවා කාර්යයන් ඉටුකිරීමේදී අනෙකුත් අමාත්‍යාංශ සමඟ අන්තර් සබඳතාවය පවත්වා ගැනීම.

## ප්‍රගතිය 2013

- ✓ අන්තර්ජාතික ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාළ සියළු කාර්යයන් ඉතා කාර්යක්ෂමව මෙන්ම ඵලදායීව අන්තර්ජාතික පිළිගැනීමට ලක්වන ආකාරයට ඉටුකිරීම සම්බන්ධිතව සිදුකෙරෙන නීති සහ රෙගුලාසි සැකසීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දායකත්වය ලබාදීම.

- ✓ අන්තර්ජාතිකව ගුවන් ගමනාන්ත සහ ගමන්වාර වැඩිකර ගැනීමට අදාළව ඒ ඒ රටවල් සමඟ ද්විපාර්ශ්වික ගුවන්සේවා සාකච්ඡා පැවැත්වීම හා ගිවිසුම් සඳහා එළඹීම.

  උදා:අසර්බයිජාන්, සී ෂෙල්ස් - නව ද්විපාර්ශවීය ගිවිසුම්

  ඉන්දියාව, කොරියාව, කසකස්ථාන් - ගිවිසුම් යාවත්කාලීන කළ රටවල්

- ✓ 2013 වර්ෂයේ දකුණු අප්‍රිකාවේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය පවත්වනු ලැබූ ජාත්‍යන්තර ගුවන් සේවා සාකච්ඡා සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකා ධූත පිරිස සහභාගී විය. මෙහිදී ඉතියෝපියාව, ෆින්ලන්තය, ග්‍රීසිය, නවසීලන්තය සමග සාකච්ඡා පවත්වා නව ගුවන් සේවා ගිවිසුම සඳහා කෙටි අත්සන් තබන ලදී.ස්පාඤ්ඤය, කෙන්යාව, තුර්කිය සහ ඩෙන්මාර්ක්, නෝර්වේ සහ ස්වීඩන් යන රටවල් සමඟ පැවති ගුවන් සේවා ගිවිසුම් යාවත් කාලීන කරන ලදී.

- ✓ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල ඉදිකිරීම් කටයුතු අවසන්කර අන්තර් ජාතික ගුවන් ගමන් සඳහා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අදාළ දායකත්වය සහ මග පෙන්වීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ✓ නව අභ්‍යන්තර ගුවන්තොටුපල ඉදිකිරීම් කටයුතු සඳහා හඳුනාගත් ප්‍රදේශවල ශක්‍යතාවයන් හඳුනාගනිමින් ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීම.

- ✓ මඩකලපුව අභ්‍යන්තර ගුවන්තොටුපල ඉදිකිරීම් කටයුතු සඳහා අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් මෙහෙයවීම් කටයුතු සිදුකිරීම.

- ✓ ඉහළ යමින් පවතින ගුවන් මගී සංතරණ පිළිබඳ සලකා බලමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල දෙවන අදියරෙහි ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි කටයුතු අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

- ✓ අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ගුවන් සේවය වන ශ්‍රී ලන්කන් සමාගම සහ අඩු පිරිවැය ගුවන් සේවය වන මිහින් ලංකා (පෞද්.) සමාගම සඳහා පසුගිය වසර තුළ ලබාදුන් ප්‍රාග්ධන දායකත්වයෙහි 2013 වාර්ෂික දායකත්වය ලබාදීමට අදාළ කටයුතු කිරීම එම මූල්‍ය කළමනාකරණයට අදාළ මගපෙන්වීම් හා පසු විපරම් කටයුතු සිදුකිරීම.

- ✓ ගුවන්සේවා ක්ෂේත්‍රයට වසර 100ක් සපිරීම නිමිත්තෙන් 2012 වර්ෂ අවසානයේ දී සමරන ලද ගුවන්සේවා දිනය සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ✓ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධීකරණය කරමින් දැයට කිරුළ වැඩසටහන යටතේ අම්පාර ප්‍රදේශයේ සමාජ සත්කාරක වැඩසටහන සඳහා දායකත්වය ලබාදීම.

- ✓ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් සිදුකරනු ලබන විවිධ කාර්යයන්හි දී එම වැඩසටහන් බලාත්මක කිරීමට අදාළ නීති රෙගුලාසිමය කටයුතු සඳහා මැදිහත්ව අදාළ අධිකාරි බලය ලබාදීමට කටයුතු කිරීම.

# විසර්ජන ගිණුම 2013

වියදම් ශීර්ෂ අංකය: 176 අමාත්‍යංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනේ අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාල ඩී.ජී.එස්.ජ් 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | **පුනරාවර්තන** | | | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 110,000,000 | 34,371,235 | (3,170,040) | 141,201,195 | 133,075,129 | 8,126,066 | 2 |
| | උප එකතුව (පුනරාවර්තන) | **110,000,000** | **34,371,235** | **(3,170,040)** | **141,201,195** | **133,075,129** | **8,126,066** | |
| | **මූලධන** | | | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 4,200,000 | 55,600,000 | 3,170,040 | 62,970,040 | 58,588,823 | 4,381,217 | 2 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 14,996,000,000 | 120,054,262 | - | 15,116,054,262 | 14,696,780,101 | 419,274,161 | 21 |
| | උප එකතුව (මූලධන) | **15,000,200,000** | **175,654,262** | **3,170,040** | **15,179,024,302** | **14,755,368,924** | **423,655,378** | |
| | මුළු එකතුව | **15,110,200,000** | **210,025,497** | **-** | **15,320,225,497** | **14,888,444,053** | **431,781,444** | |

පිටු අංක 01 සිට 20 දක්වා ඩී.ජී.එස්.ජ් 2 සිට ඩී.ජී.එස්.ජ් 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 35 සිට 39 දක්වා ඇතුලත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

| ප්‍රධාන ගණන්දීමේ නිළධාරි | ගණන්දීමේ නිළධාරි | ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : |
| දිනය : | දිනය : | |

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| <u>ව්‍යාපෘති අංකය 01 හා නම : අමාත්‍ය කාර්යාලය</u> | | | | | | |
| පුද්ගල පඩිනඩි | 10,300,000 | 7,281,300 | 86,000 | 17,667,300 | 17,345,781 | 321,519 |
| අනෙකුත් වියදම් | 35,550,000 | 26,389,935 | 2,009,000 | 63,948,935 | 56,602,332 | 7,346,603 |
| උප එකතුව | **45,850,000** | **33,671,235** | **2,095,000** | **81,616,235** | **73,948,113** | **7,668,122** |
| <u>ව්‍යාපෘති අංකය 02 හා නම : අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා</u> | | | | | | |
| පුද්ගල පඩිනඩි | 24,850,000 | - | (86,000) | 24,764,000 | 24,576,093 | 187,907 |
| අනෙකුත් වියදම් | 39,300,000 | 700,000 | (5,179,040) | 34,820,960 | 34,550,923 | 270,037 |
| උප එකතුව | **64,150,000** | **700,000** | **(5,265,040)** | **59,584,960** | **59,127,016** | **457,944** |
| මුළු එකතුව | **110,000,000** | **34,371,235** | **(3,170,040)** | **141,201,195** | **133,075,129** | **8,126,066** |

ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:-

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය: 01 අමාත්‍ය කාර්යාලය

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වියදම්වල විස්තර | | | | | |
| | | | මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 50,000 | 15,569,000 | 15,619,000 | 15,619,000 | - |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000 | - | 100,000 | 71,136 | 28,864 |
| 2003 | | 11 | වාහන | 550,000 | 600,000 | 1,150,000 | 1,149,250 | 750 |
| | | | මූලධන වත්කම් අත්පත් කරගැනීම | | | | | |
| 2101 | | 11 | වාහන | - | 24,000,000 | 24,000,000 | 19,675,682 | 4,324,318 |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500,000 | 1,588,840 | 2,088,840 | 2,088,706 | 134 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපරණ | 300,000 | 781,000 | 1,081,000 | 1,080,544 | 456 |
| | | | එකතුව | 1,500,000 | 42,538,840 | 44,038,840 | 39,684,316 | 4,354,524 |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:-

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය: 02 අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාසාරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>මූලධන වියදම්වල විස්තර</u> | | | | | |
| | | | <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය</u> | | | | | |
| | | | <u>හා වැඩිදියුණු කිරීම</u> | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිරිකිරීම් | 100,000 | 16,000,000 | 16,100,000 | 16,099,720 | 280 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000 | - | 100,000 | 86,517 | 13,483 |
| 2003 | | 11 | වාහන | 600,000 | 377,000 | 977,000 | 976,672 | 328 |
| | | | <u>මූලධන වත්කම් අත්පත් කරගැනීම</u> | | | | | |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500,000 | 89,500 | 589,500 | 589,458 | 42 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපරණ | 750,000 | - | 750,000 | 743,480 | 6,520 |
| | | | <u>හැකියා වර්ධනය</u> | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 650,000 | (235,300) | 414,700 | 408,660 | 6,040 |
| | | | එකතුව | 2,700,000 | 16,231,200 | 18,931,200 | 18,904,507 | 26,693 |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:-

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

වැඩ සටහන් අංකය හා නාමය : 02 සංවර්ධන ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය: 03 සිවිල් ගුවන්සේවා සංවර්ධනය

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල කටුනායක | | | | | |
| 1(2104) | | 11 | දේශීය අරමුදල් | - | 119,972,146 | 119,972,146 | 119,000,000 | 972,146 |
| | | | දකුණු ජාත්‍යන්තර ගුවන්තොටුපල - මත්තල | | | | | |
| 2(2104) | | 17 | විදේශාධාර සබැඳි දේශීය අරමුදල් | 2,000,000 | - | 2,000,000 | 1,416,089 | 583,911 |
| | | | ප්‍රාග්ධන අයෝජනය - ශ්‍රී ලංකන් ගුවන්සමාගම | | | | | |
| 7(2502) | | 11 | දේශීය අරමුදල් | 12,600,000,000 | 82,116 | 12,600,082,116 | 12,600,082,116 | - |
| | | | ප්‍රාග්ධන අයෝජනය - මිහින් ලංකා ගුවන්සමාගම | | | | | |
| 8(2502) | | 11 | දේශීය අරමුදල් | 1,894,000,000 | - | 1,894,000,000 | 1,894,000,000 | - |
| | | | එකතුව | **14,496,000,000** | **120,054,262** | **14,616,054,262** | **14,614,498,205** | **1,556,057** |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:-

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

වැඩ සටහන් අංකය හා නාමය : 02 සංවර්ධන ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය: 03 සිවිල් ගුවන්සේවා සංවර්ධනය

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>අභ්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධනය</u> | | | | | |
| | | | <u>මඩකළපුව</u> | | | | | |
| 9(2104) | | 11 | දේශීය අරමුදල් | 500,000,000 | - | 500,000,000 | 82,281,897 | 417,718,104 |
| | | | එකතුව | **500,000,000** | - | **500,000,000** | **82,281,897** | **417,718,104** |

ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:-

# සිවිල් ගුවන්සේවා අධිකාරිය

**දැක්ම**

ජාතික ආර්ථික වර්ධනය උදෙසා ප්‍රධාන උත්ප්‍රේරකයක් බවට පත්වීම

**මෙහෙවර**

උපායමාර්ගික සැළසුම්කරණය සහ ප්‍රබලකර පාලනය මගින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පරිචයන්ට අනුගත,නිරුපද්‍රිත,සුරක්ෂිත සහ කාර්යක්ෂම ජාතික සිවිල් ගුවන්සේවා කර්මාන්තයක් මෙහෙයවීම සුසාධනය කිරීම.

අරමුණු

- රාජ්‍ය වෙත පැවරී ඇති සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර බැඳීම් සහ වගකීම් ඉටු කිරීම සහ නිර්දේශිත පරිචයන් නිතිපතා ක්‍රියාත්මක කරවීම
- සම්බාධක /සීමා පැනවීම් රහිත ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා පද්ධතිය ජාත්‍යන්තර පිළිගැනීමට ලක් කිරීම
- සිවිල් ගුවන්සේවාවෙහි නිරුපද්‍රිතතාව, සුරක්ෂිතතාව,කාර්යක්ෂමතාව සහ විධිමත්භාවය සහ පුද්ගල ආරක්ෂාව සහතික කිරීම
- ශ්‍රී ලංකා ගුවන් තලය ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ යහපත උදෙසා උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම
- රටෙහි ආර්ථික සංවර්ධනය
- අහේතුක තරගකාරීත්වය නිසා සිදුවන ආර්ථික අපතේ යාම වැලැක්වීම
- පුද්ගලයන්ගේ සහ භාණ්ඩවල පිවිසුම හා චලනය වැඩිදියුණු කිරීම
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ විශ්වාස කටයුතු සේවා සැපයීම
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි අධ්‍යාපනය
- සිවිල් ගගන නාවික කාර්යන්හි සියලු අංශ කෙරෙහි අනුග්‍රහය දැක්වීම
- පොදු සෞඛ්‍ය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම
- පරිසර සංරක්ෂණය සහතික කිරීම

1946 සිට පැවති සිවිල් ගුවන් සේවා දෙපාර්තුමේන්තුව අහෝසි කර 2002 අංක 34 දරණ සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත මගින් වර්ෂ 2002 දෙසැම්බර් මස 27 වන දින සිට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවන ලදී. එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය යටතේ අදාළ විගණන කාර්යන් සඳහා රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වශයෙන් සළකනු ලැබේ.සිවිල් ගුවන් සේවා අධිකාරිය සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විතවන අතර ඒ අතරින් පස්දෙනෙකු සිවිල් ගුවන් සේවා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර තිදෙනෙක් නිල බලයෙන් පත්වනු ලැබේ.ශ්‍රී

ලංකාවේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි කටයුතු නියාමනය කිරීමේ වගකීම පැවරී ඇති ආයතනය වන්නේ සිවිල් ගුවන්සේවා අධිකාරියයි. ඒ අතරම, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි පාර්ශවකරුවකු වශයෙන්, ක්‍රියාත්මක කිරීමට බැඳී ඇති චිකාගෝ සම්මුතියට අදාළ ඇමුණුම් 18 හි අඩංගු ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා ප්‍රමිතීන් සහ නිර්දේශිත ව්‍යවහාරයන් රටතුළ නීතිගත කිරීමට කටයුතු කර ක්‍රියාවට නැංවීමේ වගකීමද මෙම ආයතනයට පැවරී ඇත. එලෙසම පැහැදිලි හා සංක්ෂිප්ත ගුවන් සුරක්ෂිතතා අවශ්‍යතාවයන් භාවිතයේ යෙදවීම සහ ක්‍රියා පටිපාටීන් ප්‍රවර්ධනය කිරීම සහ පැනවීම හෝ සම්මත කර ගැනීම, සහ ප්‍රමිතීන් සුරක්ෂිතව ක්‍රියාවේ යෙදවීම පිළිබඳව කටයුතු කිරීමට සිවිල් ගුවන් සේවා අධිකාරියට බලය පවරා තිබේ. තවද සිවිල් ගුවන් සේවා අධිකාරිය සිවිල් ගුවන් සේවාවේ සංවර්ධනයට සහ සිවිල් ගුවන්සේවා සම්බන්ධ ගැටළු වලට උපාය මාර්ගික උපදෙස් දීමටද බැඳී සිටියි.

## භෞතික ප්‍රගතිය 2013

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සිදු කරන ලද කර්ත්‍යවන්හි ප්‍රමුඛත්වයක් ගන්නා ලද්දේ ප්‍රධාන වශයෙන් සහතික කිරීම් සහ විමර්ශන ක්‍රියාවලියන්හි නිරත වීමයි. එමෙන්ම එම කාලසීමාව තුළ ආයතනය ප්‍රතිව්‍යහගත කිරීමේ ක්‍රියාවලියට අදාළ කටයුතු මෙන්ම කාර්ය මණ්ඩල පුහුණු කිරීම තුළින් ආයතනික ධාරිතාව ඉහළ නැංවීමට උත්සාහ දරන ලදී. එයට අමතරව සිවිල් ගුවන් සේවා අධිකාරියට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතුද ආරම්භ කරන ලදී.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල ජාත්‍යන්තර මගී ප්‍රවාහනය සඳහා සහතික කිරීම පළමු කාර්තුව තුළ ඉහළම ප්‍රමුඛතාවයක් ගෙන සිදු කරන ලදී. අවශ්‍ය මෙහෙයුම් පද්ධති ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් නිරන්තර සෝදිසි කිරීම්, ක්ෂේත්‍ර චාරිකා සහ රැස්වීම් මගින් ගුවන්තොටුපල මෙහෙයුම්කරුට සහාය දැක්වීම සහ උපදේශණ සිදුකර මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල සහතික කිරීම සඳහා වන විගණනය 2013 මාර්තු මස 04 වන දින සිට 08 වන දින දක්වා පවත්වන ලද අතර සතියකට පසු තවත් දින දෙකක විගණනයක් ද පවත්වන ලදී. එහිදී ගගන යාත්‍රාංගන මෙහෙයුම්, ගගන නාවික සේවා සැපයීම්, අනතුරකදී මුදවා ගැනීම් සහ ගිනි නිවීම්,ආරක්ෂාව,ගුවන් මෙහෙයුම්,බිම් මෙහෙයුම්, ගුවන් යානා නඩත්තුව, ඉන්ධන සැපයීම හා අනුයාත සේවාවන් වන ආහාර සහ ජලය සැපයීම, ගුවන් යානා අභ්‍යන්තර පිරිසිදු කිරීම් සහ ගුවන් ප්‍රවාහන සහ මගී පහසුකම් සැපයීම යන අංශ විගණනයට ලක්කිරීමෙන් සිවිල් ගුවන් සේවා නියාමනයට ඇතුළත් නියෝගවලට අනුකූලවීම සහතික කරන ලදී.ගුවන්තොටුපොළ ප්‍රධාන සැළැස්මට අදාළ කොටස් ක්‍රියාවෙහි යෙදවීම පිළිබඳ විගණනයේදී තවදුරටත් සොයාබලන ලදී. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් විගණනය සම්බන්ධ සියලු කටයුතු නිමකර 2013 මාර්තු 18 වන දින අවශ්‍ය අනුකූලතා සහතික නිකුත් කිරීම මගින් ගුවන් තොටුපොළ විවෘත කිරීම සඳහා පහසුකම් සළසන ලදී. සිවිල් ගුවන් සේවා අධිකාරිය මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි විමර්ශන කටයුතු නොකඩවා සිදු කරනු ලැබේ. නව ගුවන් තොටුපලේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා ගුවන් ගමන් කාල/වාර වෙන්කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී.

අභ්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධනයට අදාළව මඩකළපුව ගුවන් තොටුපොළහි ධාවන පථය මීටර් 1066 සිට මීටර් 1535 දක්වා පුළුල් කිරීමටත් MA 60 වර්ගයේ මගීන් 48 ක් රැගෙන යා හැකි ගුවන් යානයක් මෙහෙයුම් කිරීමට හැකි පරිදි සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ මගපෙන්වීම යටතේ සිදු කරන ලදී. නව අභ්‍යන්තර ගුවන්තොටුපොළක් ඉදිකිරීමට සුදුසු ස්ථානයක් නුවර එළිය ප්‍රදේශයේ හඳුනා ගන්නා ලදී.

ගුවන් තොටුපොළ යටිතල පහසුකම් දියුණු කිරීමේ ප්‍රතිලාභ ගුවන් සමාගම් වලටද අවසානයේ ගුවන් මගීන්ටද ලැබේ. ගුවන් සමාගම් මෙහෙයුම් ඉහළ යාම රටතුළ ගුවන්සේවාවේ වර්ධනයෙහි ධනාත්මක සළකුණයි. කොරියන් එයාර් ගුවන් සමාගම,ටර්කිෂ් එයාර් ලයින්ස් ගුවන් සමාගම සහ බ්‍රිටිෂ් එයාවේස් ගුවන් සමාගම විදෙස් ගුවන් මෙහෙයුම් සඳහා සහතික කරන ලද අතර සිය මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළටත් ඉන් පිටතටත් මගී ප්‍රවාහන සේවා ආරම්භ කිරීම සිදු කර ඇත.

ගුවන් මෙහෙයුම් සමාගම් සහතික කරන අවස්ථාවේදී පැවති ප්‍රමිතීන් එලෙසම පවත්වාගෙන යන බවට සහතික වීම. සඳහා නියාමන විගණන,රැම්ප් පරීක්ෂණ, අතරමග පරීක්ෂණ මෙහෙයුම්, ප්‍රධාන මධ්‍යස්ථාන පරීක්ෂණ, ඇතුළු විමර්ශන සමාලෝචනයට ලක්වන කාල සීමාව තුළ සිදුකර ඇත. ඉලෙක්ට්‍රොනික් ෆ්ලයිට් බෑග් භාවිතය සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති නිකුත් කිරීම තුළින් ගුවන් යානය තුළ භාවිත වන පත්‍රිකා ප්‍රමාණය අවම කිරීමට පහසුකම් සළසා දී ඇත.

නව අභ්‍යන්තර ගුවන් මෙහෙයුම් සමාගමක් ලෙස සිනමන් එයාර් (Cinnamon Air)සඳහා ගුවන් මෙහෙයුම් සහතිකය නිකුත් කිරීම මගින් රටතුළ ගුවන් ගමන් වර්ධනයට දායක වී ඇත. සිනමන් එයාර් ජලජ ගුවන් මෙහෙයුම් මේ වසර තුළ ආරම්භ කරන ලදී. පොල්ගොල්ල ජලාශය සහ දියවන්නා ඔය නව ජලජ යාත්‍රාංගන ලෙස අනුමත කරන ලදී. තවද වර්ෂය තුළ අභ්‍යන්තර ගුවන් මෙහෙයුම් සහතික බලපත්‍ර හතරක් අලුත් කරනු ලැබීය. විනෝදාත්මක කටයුතු සඳහා ගුවන් සේවාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීමක් ලෙස සංචාරකයන් ඉලක්ක කර ගනිමින් 2013 පෙබරවාරි මස පැරා මෝටරින් ප්‍රදර්ශනයක් පවත්වන ලදී. උණුසුම් වායු බැලූන කටයුතු ද 2013/2014 සෘතුව සඳහා ආරම්භ කරන ලදී.

ගුවන් යානයක ගුවන් යෝග්‍යතාව ගුවන් සුරක්ෂිතතාවය පවත්වාගැනීමට අවශ්‍ය වැදගත් සාධකයකි. සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි ප්‍රධාන වගකීමක් වන්නේ රටෙහි ගුවන්සේවා කර්මාන්තයෙහි අඛණ්ඩ නිරුපද්‍රිතතා කාර්ය සාධනය පවත්වා ගැනීමට බලපාන ගුවන් යෝග්‍යතා අංගයන් වන ගුවන් ප්‍රවාහන මෙහෙයුම්කරුවන්, අනුමත නඩත්තු සංවිධාන සහ පුද්ගලයින් හෝ ආයතන වැඩිදියුණු කිරීම, අළුත් වැඩියා සිදුකිරීම්, ගුවන් යානා සහ එහි සංරචක නඩත්තු කිරීම්, අදාළ පුද්ගලයින් පුහුණු කිරීම සිදු කිරීමයි.

ගුවන් යෝග්‍යතාවයට අදාළ නියාමන කාර්යයක් ලෙස නව නඩත්තු සංවිධාන නමයක්(9) සහතික කරන ලද අතර සහතික ලත් පනස්හත්(57) දෙනෙකු ගේ සහතික අළුත් කරන ලදී. නව ගුවන් යානා එකොළහක් (11) ලියාපදිංචි කරන ලද අතර ගුවන් යානා පනස් හතරක (54) ක ලියාපදිංචිය අළුත් කරන ලදී. විමර්ශන කාර්යයන් දෙසිය තිස් නමයක් (239) ක් පවත්වන ලද අතර වැඩපොළ අනුමැතීන් හතලිස් හතරක් (44) ලබා දී ඇත. ගුවන් යෝග්‍යතා සහතික හයක් (06) නිකුත් කරන ලද අතර විසි හතක් (27) අළුත් කරන ලදී. ගුවන් සේවා සිදුවීම් 93 ක් සමථයකට පත් කරන ලදී.

ගුවන් නිරුපද්‍රිතතා ක්ෂේත්‍රයෙහි පියසරයන්, ගුවන්යානා නඩත්තු කිරීම් සහ ගුවන් ගමන් පාලන කටයුතු යනාදී කාර්යන්හි නිරතවන පුද්ගලයින්ට සහතික නිකුත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් පවත්වාගෙන ගැනීම ප්‍රධාන නියාමන කාර්යයකි.

පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට පුහුණු ආයතන සහ පුහුණු පාඨමාලා අනුමත කිරීම් සහ අදාළ විභාග පැවැත්වීම්, අවශ්‍ය පරිදි උපදේශකයින් පරීක්ෂකයින් අනුමත කිරීම, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ සහ පැවැත්වීම වෛද්‍ය පරීක්ෂණ යනාදිය අඩංගු වේ. ඉහත ඇතැම් කරුණු වලට අදාලව බලපත්‍ර අළුත් කිරීම්ද සිදු කර ඇත.

සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ ශිෂ්‍ය පුහුණු නියමු බලපත්‍ර 126 ක්ද, පෞද්ගලික නියමු බලපත්‍ර 36 ක්ද, වාණිජ නියමු බලපත්‍ර 76 ක්ද වෘත්තීය ගුවන් නියමු බලපත්‍ර 30 ක්ද, ඇතුලු පුද්ගල බලපත් සහ සහතික පත් 910 ක් නිකුත් කර ඇත. මෙයට අමතරව ගුවන් යානා නඩත්තු සහතික 73 ක් ද පියසර මෙහෙයුම් නිලධාරී සහතික 14ක්ද මැදිරි සේවක පිරිස් සහතික 229ක් ද නිකුත් කර ඇත. බලපත්‍ර අළුත් කිරීම් යටතේ ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර 401,ගුවන් ගමන් පාලක බලපත්‍ර 26ක් ද මැදිරි සේවක පිරිස් බලපත්‍ර 512 ක්ද නිකුත් කර ඇත.

සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ පියසර පුහුණු පාසැල් පරීක්ෂණ ,ගුවන් සමාගම් මෙහෙයුම්, නඩත්තු සංවිධාන අනුමැතීන් සහ පියසර පුහුණු පාසැල් සහතික කිරීම් වලට අදාල 2013 වාර්ෂික විමර්ශන කටයුතු 100%ක් නිම කර ඇත.

පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම ස්වයංක්‍රීය පද්ධතියක් යටතට ගැනීම සේවා සැපයීමේ කාර්යක්ෂමතාව, නිවැරදිතාව සහ ගුණාත්මක බවට අත්‍යවශ්‍ය කාරණයකි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවයේ නියුතු නියමුවන්ගේ හමුදාමය පළපුරුද්ද සිවිල් ගුවන් නියමු බලපත්‍රයක් නිකුත් කිරීමේදී පිළිගැනීම සඳහා

අවශ්‍ය ක්‍රමවේදය සකස්කරමින් පවතී. මාලදිවයිනේ සිදු කරනු ලබන ගුවන් නියමු බලපත්‍ර විභාගයන් හඳුන්වාදීමද පිරිස් බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන වෛද්‍ය පරීක්ෂණ පද්ධතිය වර්ධනය කිරීම තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතට අදාළව ගුවන් සේවා ආරක්ෂක නියාමනයන් ක්‍රියාවට නැංවීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් නිකුත් කරන ලද නවතම ප්‍රමිතීන්ට අනුකූලව අදාළ පරිශීලන වැඩිදියුණු කරන ලද අතර ක්ෂේත්‍රයෙහි අදාළ පුද්ගලයින් වෙත බෙදා හැර ඇත.

ගුවන් තොටුපොළ ආරක්ෂණ සේවා සපයන්නන් සහතික කිරීම ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම හා එක්ව සිදු කරන ලදී. සුරක්ෂිතතා සෝදිසි කරන්නන් ලෙස 349 දෙනකු සහතික කරන ලදී.විශේෂ ගුවන්සේවා සුරක්ෂිතතා පුහුණු වැඩසටහනක් ජනාධිපති ආරක්ෂක අංශ නිලධාරීන් 25 දෙනෙකු සඳහා පවත්වන ලදී.

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පවත්වන ලද විගණනයේදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන්ට අනුකූලව සිවිල් ගුවන් සේවාවේ නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතාව පවත්වාගැනීමේ ප්‍රතිශතය 85%ක් ලෙස පවත්වාගනු ලැබිණ. මෙම ජයග්‍රහණය, ගුවන් සමාගම් මෙහෙයුම් කරුවන් සිය මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළට සිදු කිරීමේ විශ්වාසය තහවුරු කිරීමට හේතුවන බැවින් සංචාරක කර්මාන්තයේ වර්ධනය හා රටෙහි ආර්ථික වර්ධනයේ සාධනීය කාරකයක් වනු ඇත.

ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශීය ගුවන් සමාගම් සඳහා නව ගමනාන්ත මාර්ග විවර කරමින් දකුණු කොරියාව, සී ෂෙල්ස්, අසර්බයිජාන්, කසකස්ථාන් හා ඉන්දියාව යන රටවල් සමග සහ දකුණු අප්‍රිකාවේ පැවති ජාත්‍යන්තර සමුළුව නියෝජනය කරමින් ද්විපාර්ශවික ගුවන් සාකච්ජා සිදු කරන ලදී. මේ වර්ෂය තුළදී බ්‍රිටිෂ් ගුවන් සමාගම, කොරියන් ගුවන් සමාගම, එයාර් ඒෂියා X , සහ ටර්කිෂ් ගුවන් සමාගම පිළිවෙලින් ලන්ඩන්, සෝල්, ක්වාලාලම්පූර්, සහ ස්ථාන්බුල් සිට ශ්‍රී ලංකාවට ගුවන් මෙහෙයුම් සිදු කරන ලදී. මෙය රටෙහි ආර්ථිකය හා සංචාරක කර්මාන්තයේ වර්ධනයට රුකුලක් වනු ඇත.

2013 නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ පැවැති පොදු රාජ්‍ය මණ්ඩල සමුළුවේදී ගුවන් මෙහෙයුම් සඳහා අනුමැතීන් ලබා දෙමින් සිවිල් ගුවන් සේවා අධිකාරිය සුවිශාල කාර්යයක් ඉටු කරන ලද අතර පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව පැවති කාල වකවානුව තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ගුවන් මෙහෙයුම් සම්බන්ධව නිරුපද්‍රිතතා හා ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් පැය 24 තුළ සුරක්ෂිතතා කාර්යයන් ඉටු කරන ලදී.

නව ගුවන් ප්‍රවාහන සමාගම් 107 ක් සඳහා බලපත්‍ර ලබා දී ඇති අතර 395ක බලපත්‍ර අළුත් කරන ලදී. මෙය ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථා සහ ව්‍යාපාර ජනිත කිරීමට පිටිවහලකි. සංචාරක කර්මාන්තයට අවශ්‍ය මනා පුහුණු මානව සම්පත් බිහිකිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් 07 වන ශිෂ්‍ය කණ්ඩායම සඳහා ආසන වෙන් කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව සම්පූර්ණ කරන ලදී. අනුමත නොකරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් හා සංචාරක නියෝජිතවරුන්ට එරෙහිව ඉදිරිපත් කරන ලද පැමිණිලි ගැන කටයුතු කරන ලදී.

සිවිල් ගුවන් සේවා අධිකාරිය සිය ප්‍රධාන කාර්යයක් ලෙස ගුවන් සුරක්ෂිතතාව හා ගගන සංතරණ සේවාවල අනුකූලතාව සහ කාර්යක්ෂමතාව සහ වෘත්තීමයභාවය නියාමන ආයතනය වශයෙන් බලාපොරොත්තු වේ. මේ සම්බන්ධයෙන් මානව සම්පත් වැඩිදියුණු කිරීම, කාර්යාල කළමනාකරණය සහ මුදල් කළමනාකරණය සම්බන්ධයෙන් ඒකාබද්ධ ශාඛාව අත්‍යාවශ්‍ය කාර්යයක් ඉටුකරනු ලැබේ.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ විෂය පථය ගත් කළ එහි සුවිශේෂී වූ මානව සම්පත් අවශ්‍යතාවයක් වන්නේ සේවකයන්හට ලබා දිය යුතු පුහුණුවීම් වැඩසටහන්ය.මෙහිදී ආයතනයේ තාක්ෂණික සහ විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා සකස් කරන ලද විශේෂ පුහුණු සැළැස්මක් ක්‍රියාත්මක වේ. මෙම සැලැස්ම භාවිත කරමින් වාර්ෂිකව විධායක නිලධාරීන්ටද, තාක්ෂණික නිලධාරීන්ටද පොදුවේ ගත්කළ අනෙකුත් සියලු මට්ටම් වල සේවකයින් සඳහා ද වූ වාර්ෂික පුහුණු වැඩසටහනක් සෑම වසරකම

අධිකාරියෙහි අනුමැතිය යටතේ ක්‍රියාත්මක වේ. මේ වසර තුළදී විදේශීය පුහුණු අවස්ථා 32 ක්ද දේශීය පුහුණු අවස්ථා 263 ක්ද පිළිවෙළින් රු මිලි.16 ක හා රු මිලි. 1.4 ක වියදමක් දරා ලබාදී ඇත. මෙයට අමතරව ලෝක ගුවන් සේවා කර්මාන්තය සමග ගනුදෙනු කිරීම සඳහා විදේශීය රැස්වීම් සම්මන්ත්‍රණ හා වැඩමුළු වලට රු.මිලි. 22 ක් වැය කර ඇත.

සිවිල් ගුවන්සේවාව ජාත්‍යන්තර කර්මාන්තයක් බැවින් ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාම සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සිදු කළ යුතු කාර්යයකි.එබැවින් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ 38 වන සම්මේලනය ඇතුළුව ප්‍රධාන ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ ගණනාවකටම සිවිල් ගුවන් සේවා අධිකාරිය සහභාගීවනලදී. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ 38 වන සම්මේලනයේදී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ආර්ථික කොමිසමෙහි උප සභාපති වශයෙන් පත් කරන ලදී. 2016 දී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරුන්ගේ සමුළුව සඳහා සංවිධානමය කටයුතු නිරීක්ෂණය අරමුණු කොට ගනිමින් බැංකොක් හි පවත්වන ලද 50 වන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරුන්ගේ සමුළුවට සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියෝජිත පිරිසක් සහභාගී විය.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය අවශ්‍ය සංශෝධන අන්තර්ගත කරමින් අළුත් කරන ලදී. තාක්ෂණික පුස්තකාලය සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලයට මෙන්ම ගුවන් සේවා කර්මාන්තයේ නිරතවන පිටස්තර පුද්ගලයන්ටද පහසුකම් සළසන ලදී.

සිවිල් ගුවන් සේවා අධිකාරිය ප්‍රතිව්‍යහගතකරණය සඳහා අවශ්‍ය යොජනා සකස් කර ඇත. එම යෝජනා මේ වන විට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ සහ වැටුප් කොමිසමේ සාකච්ඡා මට්ටමේ පවතින අතර කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ වන විටත් ලැබී ඇත.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍යමය තොරතුරු ගණනය හා ඉදිරිපත් කිරීම කාර්යක්ෂමව හා වඩා නිවැරදිව සිදු කිරීම සඳහා 2012 වර්ෂයේදී තොරතුරු ස්වයංක්‍රීය පද්ධතියක් යටතට පත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව මේ වන විට මූල්‍ය කළමණාකරණ කටයුතු ස්වයංක්‍රීය පද්ධතියක් මගින් සිදුකරනු ලබයි. විවිධ දත්ත හා තොරතුරු සමග ඒකාබද්ධ වෙමින් කටයුතු කිරීමේ හැකියාව මෙම පද්ධතියට පවතී. එමෙන්ම දත්ත එකතු කිරීම හා විශ්ලේෂණය, ආයතනයේ වෙනත් අංශ මගින් නිකුත් කරන ගෙවීම් වවුචර් සමග පරිගණක මගින් සෘජුව සම්බන්ධ වීමේ හැකියාව යනාදී මූල්‍ය අංශය විසින් සිදු කරන ආයෝජන වාර්තා සකස් කිරීම,වැටුප් ගෙවීම්,ගෙවීම් ගණනය කිරීම්, භාණ්ඩ ලේඛන සැකසීම යනාදී සියලු කටයුතු පරිගණක ගත කොට කාර්යක්ෂමව සිදු කරනු ලැබේ.


තවද සිවිල් ගුවන් සේවා අධිකාරිය අනාගත ගුවන් සේවාවට අවශ්‍ය පිරිස් බලය වර්ධනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘතියක්ද අරඹා ඇත. සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම පාසැල් දරුවන් අතර බෙදා දීම සඳහා සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපනික කමිටුව පිහිටුවන ලදී. සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ සිසු දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් දහසයක් (16) පවත්වා ඇත. සිසු දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මුද්‍රණය කරනු ලබන 'ගුවන්සර' ත්‍රෛමාසික අධ්‍යාපනික සගරාව උසස් පෙළ පන්ති පවත්වන පාසල් 3100 ක් සඳහා , නොකඩවා නොමිලේ ලබා දෙනු ලැබේ.


මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඉදිකිරීමත් සමග පැවරී ඇති රාජකාරීන් වඩා කාර්යක්ෂමව හා නොපිරිහෙලා ඉටු කිරීම සඳහා අවශ්‍ය ආයතනයෙහි උප කාර්යාලයක් මත්තල රාජපක්ෂ ගුවන් ගුවන්තොටුපළ පරිශ්‍රයෙහි ඉදි කිරීමට තීරණය කරන ලදී.මේ වසරේ ජුනි මස ආරම්භ කරන ලද ඉදිකිරීමේ කටයුතු 2013 දෙසැම්බර් මස අවසාන කරන ලදී.


එමෙන්ම සිවිල් ගුවන් සේවා අධිකාරිය සඳහා ප්‍රධාන ගොඩනැගිල්ලක් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පරිශ්‍රයේ ඉදි කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත

| | | | |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය** | | | |
| **<u>විස්තීර්ණ ආදායම් ප්‍රකාශය</u>** | | | |
| **<u>2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා</u>** | | | |
| | | | |
| | **<u>31.12.2013</u>** | | **<u>31.12.2012</u>** |
| | <u>රු. සත.</u> | | <u>රු. සත.</u> |
| *<u>ආදායම</u>* | | | |
| මෙහෙයුම් ආදායම | 1,078,895,686.64 | | 918,524,428.11 |
| | | | |
| අනෙකුත් ආදායම් | 99,816,472.46 | | 70,467,194.05 |
| | | | |
| **සමස්ත ආදායම** | **1,178,712,159.10** | | **988,991,622.16** |
| | | | |
| *<u>වියදම</u>* | | | |
| | | | |
| සේවක මණ්ඩල වියදම් | 156,700,965.10 | | 148,638,658.02 |
| රැස්වීම් සම්මන්ත්‍රණ හා වැඩමුළු | 33,254,645.02 | | 26,794,066.10 |
| පුහුණු වියදම් | 11,269,722.26 | | 20,106,117.69 |
| පරිපාලන හා අනෙකුත් වියදම් | 136,960,888.79 | | 148,764,416.90 |
| ක්ෂය වීම් | 26,854,078.66 | | 26,500,919.06 |
| | | | |
| **සමස්ත වියදම** | **365,040,299.83** | | **370,804,177.77** |
| | | | |
| සාමාන්‍ය කටයුතු වලින් පැන නැගුනු ආදායම ආදායම් බදු වලට පෙර | 813,671,859.27 | | 618,187,444.39 |
| | | | |
| ආදායම් බදු | 228,159,304.45 | | 94,722,505.91 |
| | | | |
| වර්ෂයේ ශුද්ධ ලාභය | **585,512,554.82** | | **523,464,938.48** |

මූලාශ්‍රය :- අභ්‍යන්තර සංඛ්‍යාලේඛන,සිවිල් ගුවන්සේවා අධිකාරිය


වියදම 2013
ක්ෂය වීම
[7%]
සේවක මණ්ඩල
වියදම්
[43%]
පරිපාලන හා
අනෙකුත් වියදම්
[38%]
පුහුණු වියදම්
[3%]
රැස්වීම් සම්මන්ත්‍රණ
හා වැඩමුළු
[9%]


ආදායම 2013
ලංකාවෙන් පිටත
විකුණු ගුවන්
ටිකට්පත් අධිභාරය
75%
අපගමන බදු සේවා
ගාස්තු
[12%]
පොළී ආදායම
[8%]
වෙනත් මෙහෙයුම්
නොවන වියදම්
[1%]
වෙනත් මෙහෙයුම්
වියදම්
0.5%
නියාමන සේවා
ගාස්තු
[2%]
විභාග ගාස්තු
0.5%
බලපත්‍ර මුල් නිකුතුව
සහ අළුත් කිරීම්
[1%]


ආදායම බෙදී යාම -2013
ආදායම් බදු
[19%]
පුනරාවර්තන වියදම්
+ක්ෂය වීම
[31%]
ශුද්ධ ලාභය
[50%]

# ශ්‍රී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම

**දැක්ම**

“ආසියානු කලාපය තුල කාර්යක්ෂම බවින් හා සුහදත්වයෙන් ප්‍රමුඛතම ගුවන්සේවා කේන්ද්‍රස්ථානය වීම”

**මෙහෙවර**

“අප විසින් මහත් පරිශ්‍රමයක් දරනුයේ ප්‍රශස්ථ ක්‍රියාකාරකම් තුලින් තරගකාරී ගුවන් තරණ පහසුකම් හා සේවා සැපයීම මෙන්ම අපගේ ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ සංතෘප්තිය තහවුරු කිරීමටයි”

## හැඳින්වීම

ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය තුළ ගුවනේ දී මෙන්ම භූමියේදී ද ගුවන්යානා හා මගීන්ගේ ආරක්ෂාව තහවුරු කරන ගිනි නිවීම් සේවා හා ආරක්ෂක සේවා ඇතුළුව ගගන නාවික සේවා සැපයීම ද පර්යන්තය හා ඒ ආශ්‍රිත මගී පහසුකම් සැලසීමේ කටයුතු නඩත්තු කිරීම ද සමාගමේ මූලික ක්‍රියාකාරකම් වේ.

ව්‍යාස්ථාපිත සේවා සපයන්නා ලෙස සමාගමේ අරමුදල් හා ශ්‍රී ලංකා රජය විසින් අනුමත කල විදේශ ණය හා ප්‍රදානයන් යොදා ගනිමින් ගුවන්තොටුපලෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ.

## අරමුණු

- සංක්‍රමණික මගීන් ගණන මුළු මගීන් ගණනෙහි අනුපාතිකය වර්තමානයේ 1:6 සිට 2016 දී 1:4 දක්වා වර්ධනය කර බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, ආසියා ශාන්තිකර කලාපයේ මගී සංක්‍රමණික මධ්‍යස්ථානය බවට පත් කිරීම
- 2017වන විට මිලියන 15ක මගී සංඛ්‍යාවක් හැසිරවීමේ ධාරිතාවයකින් යුත් යටිතල පහසුකම් නගා සිටුවීම
- 2012 වර්ෂයේ ආකාරයෙන් 2017 වන විට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලට ගොඩබසින ගුවන් යානයකට සපයනු ලබන සේවා වෙනුවෙන් දරනු ලබන වැය 10% කින් අවම කිරීම
- 2017වන විට හසුරුවන ගුවන් මගීන් සංඛ්‍යාව මිලියන 10 දක්වා ඉහළ නැංවීම
- 2017 වන විට මුළු ගුවන් භාණ්ඩ ප්‍රමාණයෙන් (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල) 40%ක් සංක්‍රමණික භාණ්ඩ බවට පත්කර ගැනීම
- සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය තුළ කලාපීය සහභාගීත්වය 10% කින් වර්ධනය කරගැනීම
- කලාපය තුල ශ්‍රේණිගත වීම වර්ධනය කරගැනීමේ ප්‍රවණතාවයක් පවත්වා ගැනීම( සාපේක්ෂක ධාරිතාවයන් අනුව ශ්‍රේණිගත කරන විට)
- ගුවන් යානා සිදුවීම්වල පහළ බැස්සවීමේ ප්‍රවණතාවයක් පවත්වා ගැනීම
- ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් නිකුත්කර ඇති ලේඛන අංක 8973 ප්‍රකාර ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවාවේ සුරක්ෂිතභාවය සහතික කිරීම

- ආයතනික යතුරු පුවරුවේ පාරිභෝගික හා මූල්‍යමය පර්යාලෝක මිනුම් දඬු සඳහා 20%ක අවමයක් පවත්වා ගනිමින් ගුවන්තොටුපල හා බැඳුනු සියළුම ආයතනයන් හා ඒකාබද්ධව සේවා සැපයීම, ඇගයීම හා මෙහෙයුම් විශිෂ්ඨ අයුරින් නොකඩවා සැපයීම.

**භෞතික ප්‍රගතිය 2013**

**<u>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ</u>**

මෙහෙයුම් මට්ටම් වල හදිසි ඉහළ නැගීම සහ එහි ප්‍රතිඵල වූ, ගුවන් තදබද සංරචක සමඟ තදබල සහසම්බන්ධතාවයක් දක්වන ආදායම් හා ඉපැයුම් ඉහළ නැගීම නිසා ඇති වූ උද්යෝගය සමගම 2013 වර්ෂයේදී ගුවන් තොටුපොල හා ගුවන් සේවා සමාගම විශිෂ්ඨ ජයග්‍රහනයක් සලකුණු කරන ලදී.

ගුවන් තදබද දත්ත චලනයන් පහත පෙන්වන අතරතුර සමාගම, වැය ශීර්ෂ අරමුදල රඳවාගත් අරමුදල යන මූල්‍ය වාර්තාවලින් සමන්විත ඒකාබද්ධ කල මූල්‍ය වාර්තාවල ප්‍රධාන මූල්‍ය දර්ශනවල මෙම මෙහෙයුම් දත්ත කෙසේ පෙන්නුම් කෙරේද යන්න මෙම වාර්තාවේ දැක්වේ.

**<u>මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල</u>**

ගුවන් සමාගමක් වශයෙන් ආයතනික ජීව චක්‍රයේ හඳුන්වා දීමේ අවධියේ සිටින මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල දැනටමත් ගුවන් ගමන් වාර සහ මගී ගමන්වාර යන දෙඅංශයේම ක්‍රමික වර්ධනයක් පෙන්වයි. ගුවන් තදබද දත්ත පහත දක්වා ඇත.ජාතික ගුවන් සේවය,ෆලයි ඩුබායි, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ තවත් බොහෝ අන්තර්ජාතික ගුවන් තොටුපොලවල් සමග ඒකාබද්ධව සතිපතා ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක වන අතර ,රට අභ්‍යන්තර ගුවන් මෙහෙයුම්ද ඒ සමඟම ක්‍රියාත්මක වේ.

**ගුවන් සංතරණ දත්ත ( ගුවන් යානා,මගීන් සහ ගුවන් භාණ්ඩ චලනයන්)**

**<u>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ</u>**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ 2013 කාලපරිච්ඡේදය තුලදී ගුවන් යානා 50802 ( කාල සටහන් කරන ලද ගුවන් යානා, 48,646 සහ කාල සටහන් නොකරන ලද ගුවන් යානා 2156) හැසිරවිය.මෙය 2012 වර්ෂයට සාපේක්ෂව 5% වර්ධනයකි.

සංක්‍රමණික මගීන් 1, 359, 328ක් ඇතුළුව මගීන් 7, 311, 869 (ආපසු යන මගීන් 3, 682, 599 ක් හා පැමිණෙන මගීන් 3, 629, 270ක්) ගුවන්තොටුපල භාවිතා කල අතර,එය 2012 වර්ෂයට සාපේක්ෂව 3.27% වර්ධනයක් පෙන්වයි.

කාලපරිච්ඡේදය තුල මෙහෙය වූ මුළු ගුවන් බඩු ප්‍රමාණය මෙ.ටො. 193, 975 /= කි. ( අපනයන ගුවන් බඩු මෙ.ටො. 122, 019 හා ආනයන ගුවන් බඩු මෙ.ටො. 71,956) පෙර වර්ෂය හා සසඳන කල 3.94% වර්ධනයක් පෙන්වයි.

**මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල.**

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල 2013 කාල පරිච්ඡේදය තුලදී (එනම්,2013 මාර්තු මස 18 සිට දෙසැම්බර් මස 31 යන කාල පරිච්ඡේදය තුල)ගුවන් යානා 1362 හැසිරවනු ලැබීය.

එම කාලපරිච්ඡේදයේදී ( 2013 මාර්තු මස 18 සිට දෙසැම්බර් 31 දක්වා) ගුවන් තොටුපොල සංක්‍රමණික මගීන් 10,938ක් ඇතුළුව මගීන් 36,137 (ආපසු යන මගීන් 22,853 ක් හා පැමිණෙන මගීන් 13,284ක්) භාවිතා කර ඇත.

ඉහත කාල සීමාව තුල මුළු ගුවන් බඩු ප්‍රමාණය මෙ.ටො.64.4 ( අපනයන ගුවන් බඩු මෙ.ටො. 27 ක් සහ ගුවන් බඩු මෙ.ටො.37.4) කි.

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටු පොලෙහි ප්‍රගතිය.**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන දෙවන අදියරේ දෙවන පියවර ක්‍රියාවලියේ මූල්‍ය යෝජනා ලංසුකරු සමඟ සාකච්ඡා කොට අවසන් කර ඇත.තබිනට් පත්‍රය ඉදිරිපත් කර කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමට අදාළ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින අතර මූලික පරීක්ෂාවන් සඳහා දල කොන්ත්‍රාත් පත්‍රයන් **JICA** වෙත භාර දී ඇත.

වාර්ෂිකව මිලියන 9 ක අතිරේක ගුවන් මගීන් සංඛ්‍යාවක් හැසිරවිය හැකි පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතියේ අදියර 11 පියවර 2 ජපන් රජයේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව , බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය 11-2 සඳහා අවශ්‍ය මුදල,රාජ්‍ය සංවර්ධන ආධාර ( **ODA** )ණය ලබාදීමට ජපන් රජය සහතික වී ඇත.ණය අරමුදල් ගිවිසුම 2012 මාර්තු මස අත්සන් තැබූ අතර,ඉතිරි අරමුදල් සඳහා අරමුදල් ලබා ගැනීමට අයදුම් පත් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී.

නව ගොඩනැගිලි පර්යන්තය සම්පූර්ණ කිරීමත් සමඟම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි වාර්ෂික මුළු සමුච්චිත ගුවන් මගීන් ධාරිතාවය මිලියන 15 කි.ව්‍යාපෘතිය 2017 වර්ෂයේ නිම කිරීමට බලා පොරොත්තු වේ.

## මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොල සංවර්ධන ව්‍යාපෘති අදියර 1 හි ප්‍රගතිය

### ගුවන් මෙහෙයුම් ඇරඹීම

වර්ෂයේ පළමු භාගයේ අපගේ මූලික අවධානය යොමු වූයේ අළුතින් ඉදි කරන ලද මත්තල,හම්බන්තොට දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ මෙහෙයුම් කටයුතු ඇරඹීම සඳහාය. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොල 2013 මාර්තු මස 13 වන දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් විවෘත කරනු ලැබීය. ගුවන්තොටුපොල ආරම්භක දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා මෙහෙය වන ලද සියළු අන්තර් ජාතික ගුවන් ගමන් ,ගුවන් මගීන් හා ගුවන් භාණ්ඩ පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ඉහත දක්වා ඇත.
ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඇ.ඩො.මිලියන 190 ක ණය මුදලක් චීනයේ එක්සිම් බැංකුව විසින් ප්‍රදානය කරන ලද අතර,මුළු කොන්ත්‍රාත් මුදල වන ඇ.ඩො.209 න් ඉතිරි කොටස ගුවන් සේවා සමාගම විසින් දරා ඇත.
මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොල අදියර 1 යටතේ ගොඩනැගුණු ප්‍රධාන අංශ පහත දැක්වේ.

### ගුවන් පථ, ගුවන් ප්‍රවේශ මාර්ග ,ගුවන් යානා නැවතුම් අංගන සංවර්ධනය

මෙම ගුවන්තොටුපල ගුවන් ධාවන පථය අංක 4F (A 380) ගුවන් යානා හැසිරවීමේ හැකියාවකින් සමන්විත වේ. ගුවන් ධාවන පථයේ දිග සහ පළල පිළිවෙලින් මීටර් 3500 සහ පළල මීටර් 75ක් වේ. මෙම ගුවන් තොටුපොල ගුවන් යානා නැවතුම් අංගන 10කින් සමන්විත වේ. ගුවන් ධාවන පථයේ 22 අන්තයේ සිට කි.මී. 1.5ක් සහ කි.මී. 1 ක් දුර ප්‍රමාණයෙන් යුත් අතුරු ගුවන් ප්‍රවේශ මාර්ග දෙකකින් ගුවන් ධාවන පථය සහ ගුවන් යානා නැවතුම් අංගනය, සම්බන්ධ කර ඇත.

### මගී පර්යන්තය

නවීන තාක්ෂණානුකූලව බලශක්තිය කාර්යක්ෂමතාවයෙන් යුක්ත වන අයුරින් නිර්මාණය කරන ලද මගී පර්යන්තය ගුවන් මගී පාලම්, ගමන් මලු හැසිරවීමේ පද්ධති, ගුවන් මගී සහ ගමන් මලු පරීක්ෂණ පද්ධති, විදුලි සෝපාන, ගුවන් යානා තොරතුරු පද්ධතිය සහ පර්යන්ත උපකරණ වැනි අන්තර්ජාතික පහසුකම් වලින් සන්නද්ධය. එමෙන්ම අනාගත පුළුල් කිරීම් සඳහා ඉඩ ප්‍රස්ථා සහිතව ඉදිකිරීම් සිදු කර ඇත.

### ගුවන් ගමන් සේවා පාලන කුළුණ සහ සංතරන උපකරණ

මීටර් 45ක් උස ගුවන් ගමන් සේවා පාලන කුළුණ ගුවන්තොටුපල සතු සුවිශේෂී අංග වලින් එකකි. සුරක්ෂිතම ගුවන් යානා සංචලන අවශ්‍යතාවය සඳහා ගුවනේ සිට ගොඩබිම් -සහ ගුවනේ සිට ගුවන් සම්බන්ධ වන අයුරින් සියළු සන්නිවේදන සහ සංතරණ උපකරණ ක්‍රමාංකනය කොට ස්ථාපිත කොට තිබේ.

### ගුවන් භාණ්ඩ පර්යන්තය

මෙම පර්යන්තය වසරකට මෙට්‍රික් ටොන් 50,000ක ධාරිතාවකින් සමන්විත වේ. භාණ්ඩ පර්යන්තය පැළැටි සහ සත්ත්ව නිරෝධන පහසුකම්වලින් සහ ශීත ගබඩා වලින් සමන්විතය.

### ගිනි නිවීමේ අංශ පර්යන්තය

නවීන දෙමහල් ගිනි නිවීමේ සේවා ස්ථාන ස්ථාපිත කර තිබේ. එය ගිනි නිවීමේ බැලුම් කුළුණක් සහ ගිනි නිවීමේ යන්ත්‍ර 5ක් නවතා තැබීමේ පහසුකම් වලින් යුක්ත වේ. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි ප්‍රභේද 10ට අදාළ ගිනි නිවීමේ පහසුකම් වලින් සන්නද්ධය.

### වෙනත් පහසුකම්

කේතුවාකාර හැඩයකින් යුත් මීටර 30 උසැති 300 m3 ජල පරිමාවක් ගබඩා කල හැකි ජල කුළුනක්, 200m3 ධාරිතාවයෙන් යුතු භූගත ළිං,අපවිත්‍ර ජල සහ ඝණ ද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති ඉදි කර තිබේ.

### පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුවේ මෙහෙයුම ( CHOGM)

පොදු රාජ්‍ය මණ්ඩල නායකත්ව සමුළුව ශ්‍රී ලංකාව තුල පැවැත්වෙන වකවානුව තුල ශ්‍රී ලංකාවට පැමැණි සහ පිටව ගිය සියලු රාජ්‍ය නායනයින් සහ රාජ්‍ය නියෝජිතයින් සාර්ථකව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හරහා මෙහෙයවනු ලැබිණි. 7000 අධික රාජ්‍ය නියෝජිතයින් සහ රටවල් 34 රාජ්‍ය නායකයින් මේ අතර විය.මගී පහසුව,ජන මාධ්‍ය කණ්ඩායම්, උසස් රාජ්‍ය නායකයින් සහ උසස් රාජ්‍ය නියෝජිතයින් සඳහා පහසුකම් සැළසීමට ආගමන පර්යන්තයේ විමසුම් පොල 5ක් සහ විගමන පර්යන්තයේ 2ක් ද පිහිටවනු ලැබේ.සමුළු කාලය තුල සේද මාවත ආගමන නියෝජිතයින් සඳහාම සීමා වී තිබුණි. තවද, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොල සහ රත්මලාන ගුවන්තොටුපොල විසින් මත්තල, යාපනය, ඉරනමඩු, නුවර වැනි රට අභ්‍යන්තර සංචාරය කල උසස් රාජ්‍ය නායකයින් හා උසස් රාජ්‍ය නියෝජිතයින් හට විශිෂ්ඨ ලෙස ඉතා වැදගත් පුද්ගල මගී සේවාවන් පිරිනමන ලදී.සෞඛ්‍ය අමාත්‍යංශය සමඟ ඒකාබද්ධව රට අභ්‍යන්තර සියලු සිවිල් ගුවන් තොටුපොල තුල විහිද යන පරිදි උසස් හා උසස් රාජ්‍ය නියෝජිතයින් හට හට අවශ්‍ය සියලු වෛද්‍ය පහසුකම් පිළියෙල කරන ලදී. රාජ්‍ය නායකයින් සහ රාජ්‍ය නියෝජිතයින්ගෙන් ලැබුනු අත්‍යන්ත වර්ණනා වනුයේ ගුවන්තොටුපල හා ගුවන්සේවා හට කවර විශාලත්වයකින් යුතු අවස්ථාවක් වුවද , උසස් හා කාර්යක්ෂමතාවයින් යුතුව කළමණාකරණය කල හැකි බවය.

### නගර ගුවන් තොටුපොලක් ලෙස රත්මලාන ගුවන් තොටුපොල සංවර්ධනය

### රට අභ්‍යන්තර මෙහෙයුම්

වර්තමානයේදී, අභ්‍යන්තර ගුවන් සේවා මෙහෙයවනු ලබන්නේ ගුවන් සමාගම් වන ෆිට්ස් ගුවන් සමාගම,හෙලී සංචාරක ගුවන් සමාගම , මිලේනියම් ගුවන් සමාගම,කොස්මොස් ගුවන් සේවය,සෙනොක් ගුවන් සේවය,ආසියානු ගුවන් සේවය සහ දයා ගුවන් සේවය විසිනි.

රත්මලාන ගුවන් තොටුපොලෙහි අභ්‍යන්තර ගුවන් සේවා ආරම්භ කිරීම සඳහා ගුවන් යානා රැඳවුම් අංගන අවකාශය භාවිතා කිරීම 2013 වර්ෂයේදී නව ගුවන් මෙහෙයුම් සමාගමක් වන ලක්වින් ගුවන් සේවය ගුවන් තොටුපල හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම සමඟ ගිවිසුම් අත්සන් කරන ලද්දේය.

## අන්තර් ජාතික මෙහෙයුම්

ගොඩබිම් හැසිරවීම, ආගමන විගමන, රේගුව සහ වෙනත් ඒ ආශ්‍රිත සේවාවන් වැනි යටිතල පහසුකම් වලින් සමන්විත කොළඹ ගුවන් තොටුපොල වර්තමානයේ අන්තර්ජාතික සංස්ථා ගත වේග යානා මෙහෙය වීම සඳහා විවෘතය.2013 වර්ෂයේ ගුවන් තොටුපොල හා ගුවන් සේවා සමාගම ගොඩබිම් හැසිර වීම් පිළිබඳ ශ්‍රී ලංකා ගුවන් සමාගම සමඟ එළඹුනු ගිවිසුමට අනුව රත්මලාන ගුවන් තොටුපොලට පැමිණෙන අන්තර්ජාතික ආයතනික වේග යානා සඳහා ගොඩබිම් පහසුකම් සැපයීමට එකඟ වී සිටී.

## 2013 වර්ෂයේ ගුවන් තොටුපොල සංවර්ධනය

1939 වර්ෂයේදී ඉදිකරන ලද රත්මලාන ගුවන් තොටුපොල පැරණි ගොඩනැගිල්ල දශක කිහිපයනට පසු ප්‍රතිසංස්කරණය කරන ලද්දේ ඓතිහාසිකත්වය සුරකෙන ලෙස නව මුහුණුවරක් එයට එක් කරමිනි. නව මගී පර්යන්තය නවීකරණය කර ඇත්තේ සියලු මගීන් හට පහසුකම් සැපයිය හැකි වන ලෙස පිටත පිවිසුම් ප්‍රදේශය ,ගුවන් ප්‍රෙදේශය දක්වා විහිදෙන ආවරණ වලින් යුත් වඩා ඉඩකඩ සහිත අවකාශ සමගිනි.

මීට අමතරව අළුතින් ඉදිකරන ලද අති නවීන වැදගත් පුද්ගල ආලිංගන,ඉතා වැදගත් පුද්ගල ආලිංගන සහ වැදගත් පුද්ගල ශාලා සහ ප්‍රතිසංසකරණ වලින් අනූන ගුවන් තොටුපොල කුමන ආකාරයක මගී චලනයක් කුමන අවස්ථාවකදී වුවද හැසිරවීමේ ධාරිතාවයෙන් සමන්විතය.

ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ( ශ්‍රී ලංකා)සමාගම


ආදායම් ප්‍රකාශය රු.මි.

| **ආදායම්** | 2013 විගණනය නොකල | 2012 විගණනය කල |
|---|---|---|
| ගගන නාවික ආදායම | 2,855 | 2,574 |
| ගගන නාවික නොවන ආදායම | 1,252 | 1,103 |
| කුලී ආදායම හා අනුග්‍රාහක ගාස්තු | 4,903 | 4,682 |
| නැව් නැගීමේ බදු | 3,205 | 2,328 |
| මෙහෙයුම් නොවන(පාඩු)/ආදායම් | (72) | 426 |
| මුළු දළ ආදායම | 12,143 | 11,114 |
| **වියදම්** | | |
| සේවක මණ්ඩල පිරිවැය | 4,156 | 3,515 |
| ආයතනික හා පරිපාලන වියදම් | 2,563 | 1,289 |
| අලුත්වැඩියා හා නඩත්තු වයදම | 411 | 205 |
| ක්ෂය වීම් | 2,120 | 1,011 |
| මුළු වියදම් | 9,250 | 6,020 |
| මෙහෙයුම් ලාභ | 2,893 | 5,094 |
| ශුද්ධ මූල්‍ය ආදායම/(වියදම) | 512 | 409 |
| ණය මත විදේශ මුදල් හුවමාරු ලාභ/(අලාභ) | 1,806 | (1,439) |
| බදු පෙරලාභ | 5,212 | 4,064 |
| අඩු කළා : ආදායම් බදු | (761) | (1,121) |
| බදු පසු ලාභ | 4,451 | 2,943 |

මූලාශ්‍රය :- අභ්‍යන්තර සංඛ්‍යාලේඛන, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ( ශ්‍රී ලංකා)සමාගම


ගුවන් යානා සංතරන

| | 2013 | 2012 |
|---|---|---|
| ජනවාරි | 4,230 | 4,156 |
| පෙබරවාරි | 3,816 | 3,876 |
| මාර්තු | 4,218 | 4,048 |
| අප්‍රේල් | 4,002 | 3,832 |
| මැයි | 4,196 | 3,922 |
| ජූනි | 4,104 | 3,874 |
| ජූලි | 4,326 | 4,094 |
| අගෝස්තු | 4,394 | 4,232 |
| සැප්තැම්බර් | 4,182 | 4,000 |
| ඔක්තෝම්බර් | 4,396 | 4,190 |
| නොවැම්බර් | 4,334 | 3,994 |
| දෙසැම්බර් | 4,604 | 4,198 |
| | **50,802** | **48,416** |




## ගුවන් මගී මෙහෙයුම්

| | 2013 | 2012 |
|---|---:|---:|
| ජනවාරි | 643,234 | 602,010 |
| පෙබරවාරි | 583,249 | 558,826 |
| මාර්තු | 610,150 | 595,441 |
| අප්‍රේල් | 585,104 | 579,872 |
| මැයි | 579,448 | 561,350 |
| ජූනි | 583,731 | 570,231 |
| ජූලි | 612,323 | 611,582 |
| අගෝස්තු | 688,600 | 647,589 |
| සැප්තැම්බර් | 586,628 | 569,427 |
| ඔක්තෝම්බර් | 606,953 | 590,627 |
| නොවැම්බර් | 566,284 | 554,095 |
| දෙසැම්බර් | 666,165 | 638,870 |
| | **7,311,869** | **7,079,920** |



**ගුවන් බඩු මෙහෙයුම්**

| | 2013 | 2012 |
|---|---|---|
| ජනවාරි | 14,806 | 13,906 |
| පෙබරවාරි | 14,558 | 14,156 |
| මාර්තු | 18,228 | 17,051 |
| අප්‍රේල් | 15,162 | 15,050 |
| මැයි | 15,932 | 15,875 |
| ජූනි | 16,162 | 16,005 |
| ජූලි | 17,544 | 17,243 |
| අගෝස්තු | 16,323 | 15,945 |
| සැප්තැම්බර් | 16,131 | 15,056 |
| ඔක්තෝම්බර් | 16,783 | 15,556 |
| නොවැම්බර් | 16,405 | 14,869 |
| දෙසැම්බර් | 15,941 | 15,906 |
| | **193,975** | **186,618** |



# ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම

**දැක්ම**

"ආසියාවේ ප්‍රියතම ගුවන් සේවය බවට පත්වීම"

**මෙහෙවර**

"අප මගී සහ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදී සිටින අතර අපගේ පාරිභෝගිකයින්ට විශ්වාසය තැබිය හැකි ප්‍රසන්න අත්දැකීමක් විඳගැනීමට සලස්වාඇත. අපගේ ව්‍යාපාරික ගනුදෙනුකරුවන් හට නවීකරණයවූත්, වෘත්තීය තත්ත්වයෙන් උසස් වූත්, ලාභ ඉපැයීය හැකි සේවා සපයන්නෙමු. අපගේ කොටස්කරුවන්ගේ අපේක්ෂා වන ලාභ ඉපැයීය හැකි සේවා සපයන්නෙමු. අපගේ කොටස්කරුවන්ගේ අපේක්ෂාව වන ලාභ ඉපයීම පරමාර්ථ කරගෙන අපවිසින් ශ්‍රී ලංකාවට සංචාරකයින් ප්‍රවාහනය කිරීමේ ප්‍රවර්ධනය කටයුතු සිදුකරන අතර අප සමාජයේ සුභසාධනය පිණිසද දායක වන්නෙමු. අප සතු කාර්යක්ෂම ප්‍රායෝගිකව කටයුතු කරන කාර්යශීලි කණ්ඩායමක් ඇති අතර අපවිසින් සංචාරක කර්මාන්තයට දක්වන ලද දායකත්වය වෙනුවෙන් කීර්තිය සහ ප්‍රශංසාවට පත්වීඇත."

**අරමුණු**

- ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිවලට සමීප සහයෝගීතාවයක් දක්වමින් දේශීය ආර්ථිකය නංවාලමින් ශ්‍රී ලංකන්ගුවන්සේවය ලොව වටා ප්‍රවර්ධනය කිරීම.

- මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩසටහනේ දක්වා ඇති පරිදි වාණිජ හා දැනුම් ක්ෂේත්‍රයන්හි කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව ගුවන්සේවා කර්මාන්තය තුළ සංවර්ධනය කිරීම.

- දේශීය සංචාරක කර්මාන්තයේ උන්නතිය සඳහා ක්‍රියාකාරී උත්ප්‍රේරකයක් ලෙස දායකත්වය ලබාදීම.

- කර්මාන්තයේ විශිෂ්ටතත්වයන්ට සමකල හැකිසේවා තත්වයන් සැපයීම.

- ආනයන හා අපනයන කාණ්ඩ දෙකම ඇතුළත් දේශීය ගුවන් භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් සැපයීම.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා ගුවන් සේවා හා ගුවන් තොටුපළ (ශ්‍රීලංකා) සමාගම ඇතුළත් වෙනත් රාජ්‍ය ආයතන මගින් සිදුකරන සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වලට සහයෝගය දීම.

- කර්මාන්තයේ විශිෂ්ටයන්ට සමකල හැකි සේවාවන් සැපයීම.

- මෙහෙයුම් සඳහා තිරසර වූ ලෝක ව්‍යාප්ත ගුවන් ගමන් ජාලය ගොඩ නැගීම.

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මෙහෙයුම් සිදුකරන ගුවන්සේවයන්ට භූමි මෙහෙයුම් සැපයීම හා එහි අනුබද්ධ සමාගමක් වන ශ්‍රී ලංකන් කේටරින් විසින් ආහාර පාන සැපයීම.

- සේවකයන්ගේ ඵලදායීත්වය වැඩිකිරීම හා සේවා විශිෂ්ටයන් ඇගයීම.

- ගුවන් සේවයේ ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වී ඇති මිත්‍ර ශීලිත්වයන් ඇගයීම.

- ගුවන් සේවය ජාත්‍යන්තර පිළිගැනීමට ලක් වී ඇති මිත්‍රශීලිත්වය, ආරක්ෂාව හා ලෙංගතු බව පවත්වා ගැනීම හා නිරන්තරයෙන් වැඩි දියුණු කිරීම.

<u>**භෞතික ප්‍රගතිය 2013**</u>

- **වන්වර්ල්ඩ් සන්ධානය -** ශ්‍රී ලංකන් ගුවන් සමාගම ලෝකයේම කීර්ති නාමයක් උසුලන වන්වර්ල්ඩ් ගෝලීය සන්ධානයේ සාමාජිකත්වය ලැබීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත.මෙමඟින් ගුවන් සමාගමේ වර්ධන සැලසුමට පහසුවක් වෙමින් ගෝලීය ගුවන් ගමන් ජාල ව්‍යාප්ත කරමින් මුළු ලෝකය පුරා නව ගමනාන්ත 824ක් කරා මෙහෙයුම් සිදුකිරීමට හැකියාව ඇත. ගුවන් සමාගමේ මගී සේවා පද්ධති වන්වර්ල්ඩ් සන්ධානයේ ප්‍රමිතීන් වලට අනුකූලව වෙනස් කිරීම තුළින් සාමාජික ගුවන් සේවා වල ගමන් ගන්නා මගීන්ගේ සංචාරක අවශ්‍යතා ඉටුකර ගැනීමටත් එක් එක් ගුවන් සමාගම් වල නිරන්තර පියාසර වැඩසටහනේ සාමාජිකයන්ට අනෙකුත් සාමාජික ගුවන් සේවාවන් හි පියාසර කිරීමට මෙයින් අවස්ථාව සැළසේ.
- **ගුවන් මැදිරි වැඩිදියුණු කිරීම්-**

  පැතලි ඇඳන් සහිත ආසන ( Flat beds ) ඇතුළුව ව්‍යාපාර පංතියේ ගුවන් මැදිරි නවීකරණය කිරීම සහ නව ගුවන් යානා විනෝදාස්වාදක පද්ධති (Inflight Entertainment systems)

- **මත්තල ( MRIA ) ගුවන් තොටුපල මෙහෙයුම් -** මඟී ගුවන් යානා සඳහා භූමි මෙහෙයුම් සේවාවන්ට සම්පූර්ණ කර දීම.මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ඉංජිනේරු මූලික නඩත්තු මෙහෙයුම් ඇති කිරීම

  - ගුවන් තොටුපල මෙහෙයුම් සඳහා රුපියල් මිලියන 766ක සමස්ථ ආරම්භක ආයෝජනය
  - රැකියා නිර්මාණය,පුහුණුව සහ 450 කාර්යමණ්ඩලයක් සඳහා රැකියා නියුක්තිය
  - ලෝකයේ ප්‍රකට ඉංජිනේරු සමාගමක් සමඟ හවුල් ව්‍යාපාර ව්‍යාපෘතියක් තුළින් ඉංජිනේරු නඩත්තු සහ අලුත්වැඩියා සහ සියළුම පහසුකම් (Engineering Maintenance, Repair and Overhauling facility)(MRO) සපුරා දීමෙන් කලාපයටම සේවා සැපයීම
  - උසස් ගුවන් සේවා තාක්ෂණික පුහුණු ඇකඩමියක් පිහිටුවීමෙන් දේශීය මෙන්ම කලාපීය වශයෙන් සිසුන්ට විවිධ පුහුණු පාඨමාලා හඳුන්වා දීම

- රට පුරා මගී සේවා නියොජිතයන් පත් කිරීම. රට තුළ නාගරික මෙන්ම ග්‍රාමීය වශයෙන් සේවා නියෝජිත කාර්යාල (PSA) පිහිටුවීම තුළින් පාරිභෝගිකයන්ට සේවා සැපයීම
- පාරිභෝගික ප්‍රතිචාර අධීක්ෂණ පද්ධතිය ( Customer Feedback System) පාරිභෝගික ප්‍රතිචාර අධීක්ෂණ පද්ධතිය හා කියෝස්ක් Kiosks, දුරකථන මෘදුකාංග (Mobile App), වෙබ් පදනම් විද්‍යුත් තැපැල් (Web Based and email) සමීක්ෂණ තුළින් ක්ෂණික පාරිභෝගික ප්‍රතිචාර වැනි ඉක්මන් සේවා සැපයීමට හැකි වීම

- A330 ගුවන් යානා නියමුවන් සඳහා දෙවැනි ගුවන් යානා සිමියුලේටරය ගුවන් නියමු පුහුණුවීම් සඳහා යොදා ගැනීම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ නියමුවන් සහ කලාපයේ අනෙකුත් ගුවන් සමාගම් සඳහා සිමියුලේටරය පුහුණුව ලබා දීම තුළින් ගුවන් සමාගමට අමතර ආදායම් ඉපැයීමට හැකිවීම
- පටු බඳු සහිත ගුවන් යානා යාත්‍රාංගනය - A320 ගුවන් යානා යාත්‍රාංගනයක් කටුනායක ගුවන් තොටුපල පරිශ්‍රයේ ඉදිකිරීම තුළින් වැඩි ගුවන් යානාවන් සඳහා පහසුකම් සැළසීමට හා තෙවන පාර්ශව වැඩකටයුතු වලට යොදා ගැනේ
- ගුවන් යානා කල්බදු කිරීම බද ගුවන් යානා 2 - කල්බදු සීමාව සම්පූර්ණ වූ ගුවන් යානා ප්‍රතිස්ථාපනය කිරීම
- ඉංජිනේරු උපාංග - ගුවන් යානා නඩත්තු කටයුතු සඳහා අවශ්‍යා ඉංජිනේරු උපාංග භාවිතය.
- කටුනායක ගුවන්තොටුපල (BIP) සඳහා අවශ්‍යා රැම්ප් සහ ගුවන් භාණ්ඩ උපාංග(Ramp & Cargo Equipmet) - ශ්‍රී ලංකන් ගුවන් සමාගමට සහ අනෙකුත් ගුවන් සේවා සඳහා භූමි මෙහෙයුම් සේවා සැපයීම
- IT/ සන්නිවේදන දෘඩාංග මෘදුකාංග - IT දෘඩාංග සහ මෘදුකාංග ඇතුලුව IT උපාංග මෘදුකාංග වැඩිදියුණුව යනාදිය සිදු කිරීම

ශ්‍රීලංකන් ගුවන් සමාගම

ආදායම් ප්‍රකාශය
අප්‍රේල් 2012 සිට **දෙසැම්බර්**
2013 දිනට

| **අප්‍රේල් 2012-මාර්තු2013** රු.මිලියන | | **අප්‍රේල් 2013 - දෙසැම්බර් 2013** රු.මිලියන |
|---|---|---|
| 119,570.90 | **ආදායම** | 88,278.63 |
| (131,598.38) | විකුණුම් පිරිවැය | (98,204.76) |
| (12,027.48) | දල ලාභය/අලාභය | (9,926.13) |
| 2,544.23 | වෙනත් ආදායම් හා ලැබීම් | 163.03 |
| (9,851.25) | විකුනුම් හා අලෙවි පිරිවැය | (7,408.69) |
| (2,522.64) | පරිපාලන වියදම් | (1,419.28) |
| (3,138.40) | මූල්‍ය වියදම් | (3,016.18) |
| 1,634.97 | මූල්‍ය ආදායම | 950.20 |
| 1,610.82 | ලාභ/ අලාභ (විනිමය අනුපාත වෙනස්වීම මත) | (825.50) |
| (21,749.75) | බදු පූර්ව අලාභය | (21,482.53) |
| - | ආදායම් බදු වියදම | - |
| (21,749.75) | වර්ෂය සඳහා ලාභය/අලාභය | (21,482.53) |
| 1,630.97 | ශ්‍රීලංකන් කේටරින් ශුද්ධ ආදායම | 1,662.16 |
| (2,400.00) | අන්තර් සමාගම් ගනුදෙනු | (1,350.00) |
| **(22,518.78)** | **සමූහයේ ශුද්ධ ලාභය/අලාභය** | **(21,170.37)** |

මූලාශ්‍රය :- අභ්‍යන්තර සංඛ්‍යාලේඛන, ශ්‍රී ලංකන් ගුවන් සමාගම

# මිහින් ලංකා පෞද්ගලික සමාගම

### දැක්ම

"ජාතික ගුවන් ගමන් ආයතනය සමඟ සහයෝගයෙන් කටයුතු කර කලාපය තුළ දෙවන හොඳම ගුවන් ගමන් ආයතනය බවට පත්වීම"

### මෙහෙවර

"ඉහළ ආරක්ෂණ ප්‍රමිතීන් යටතේ පිරිවැය ඵලදායී මෙහෙයුම් හා වටිනාකම් පදනම් කරගත් පාරිභෝගික සේවාවක් තුළින් ලාභදායීත්වය හා වර්ධනය ඉදිරියට පවත්වාගෙන යාම"

### අරමුණ

මගී ජනතාවට අඩු පිරිවැය සහිත කාර්යක්ෂම හා වෘත්තීමය බවින් පරිපූර්ණ සංග්‍රහශීලී ගුවන් ගමන් සැලසීම.

### භෞතික ප්‍රගතිය - 2013

මිහින් ලංකා කලාපයේ ජනප්‍රසාදය දිනාගත් ගුවන් සේවයක් ලෙසින් 2013 වසරේදී තම වෙළඳපොළ ස්ථානය තව දුරටත් ස්ථාවර කරගැනීමට සමත් විය. තම මූල්‍ය කාර්ය සාධනයේ කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ගත් සමාගම ශ්‍රී ලාංකීය අඩු වැය ගුවන් සේවා වෙළඳපොළෙහි විශාලතම කොටස ද හිමිකරගැනීම ට සමත් විය. මිහින් ලංකා සමඟ ගමන් කරන මගීන්ගේ හා සංචාරකයින්ගේ ශීඝ්‍ර වර්ධනයත් සමගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ගුවන් සේවයෙන් ලැබෙන දායකත්වය තව දුරටත් වර්ධනය කරවීම ට හැකි විය.

නවීන එයාර්බස් යානා 3ක ඇණියක් සමගින් මිහින් ලංකා ජාත්‍යන්තර ගමනාන්ත 10 ට සතිපතා ගමන් වාර 35 ට වඩා මෙහෙයවන අතර ශ්‍රීලන්කන් ගුවන් සේවය සමගින් ඈත පෙරදිග, මැද පෙරදිග හා දකුණු ආසියානු ගමනාන්ත ගණනාවකට ඒකාබද්ධ සේවාවන් ද සපයයි.

### පෙර වසරට සාපේක්ෂව කාර්ය සාධනය (ජනවාරි - දෙසැම්බර් කාල වකවානුව සඳහා)

- ඉතිහාසයේ ප්‍රථම වතාවට මගී සංඛ්‍යාව ලක්ෂ 5 ඉක්මවමින් 41% වාර්ෂික වර්ධනයක් සහිතව 505,259 ක අගයක් කරා වර්ධනය විය.
- පිරුණු ආසන ප්‍රතිශතය 76% දක්වා ඉහළ (පෙර වසර එම කාල වකවනුවටම: 74%) වීම.
- මුළු ආදායමෙහි ඇ. ඩො. මි. 72.37 දක්වා 49%ක වර්ධනයක් තිබීම.
- සාර්ථක වියදම් පාලන වැඩපිළිවෙලක් ඔස්සේ ඒකක වියදම සියලු තරගකරුවන් අතුරෙන් අඩුම අගයක් වන 4.59 දක්වා අවම කරන ලදී
- මෙහෙයුම් ආන්තිකයේ (අතිවිශේෂ අයිතම වලට ප්‍රථම) -17% දක්වා දියුණුවක් වීම.
- පොළී, බදු, ක්ෂයවීම් හා කල්බදු වලට පෙර ලාභදායි තත්වය ලබාගන්නා ලදී. EBITDAR ආන්තිකය 2%.

- ශ්‍රී ලංකාව වේගයෙන් වර්ධනය වන ආර්ථික දැවැන්තයෙකුට තව දුරටත් සමීප කරමින් ඉන්දුනීසියාවේ මෙඩාන් නුවරට නව ගමන් මාර්ගයක් හඳුන්වා දෙන ලදී. මෙය මිහින් ලංකා මෙතෙක් විවෘත කරන ලද සාර්ථකම ගමන් මාර්ගය බවට පත්වෙමින් ආරම්භක දිනයේ සිටම ලාභදායි තත්වයක් වාර්තා කළේය.
- ශ්‍රී ලංකාව අප්‍රිකානු මහාද්වීපය සමග දශක දෙකකට පමණ පසු නැවත සම්බන්ධ කරමින් සීෂෙල්ස් දිවයින වෙත ඍජු ගුවන් ගමන් ආරම්භ කරන ලදී.
- බහුතර ජනතාවක ට සහනදායි මිලකට ගුවන් ගමනකට අවස්ථාව සලසමින් වත්මන් ගමනාන්ත වලට ගමන් වාර තව දුරටත් වැඩි කළේය.
- මගී පහසුව ඉහළ නංවමින් හා අමතර ආදායම් වැඩි කරමින් සුළු මිලකට ගුවන් යානය තුළ චිත්‍රපට නැරඹීමේ (personal entertainment device) පහසුකම ලබා දුනිමු.
- ඉහළ කාර්යක්ෂමතාවක් හා අනෙකුත් ගුවන් සේවා සමග සම්බන්ධිත විකුණුම් අවස්ථා වලට ඉඩ සලසන නවීන අමඩියස් ආසන වෙන් කිරීමේ පද්ධතිය වෙත සාර්ථකව හුවමාරු වූවෙමු.

**මිහින් ලංකා ගුවන් සමාගම - කාර්යසාධන සාරාංශය**

| | ජන | පෙබ | මාර් | අප්රේ | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 5.07 | 5.45 | 7.00 | 5.74 | 5.67 | 6.17 | 6.25 | 7.42 | 5.71 | 6.28 | 4.98 | 6.00 |
| සෘජු මෙහෙයුම් වියදම් | 4.77 | 5.12 | 5.76 | 4.90 | 4.82 | 4.53 | 4.52 | 5.51 | 5.24 | 5.37 | 5.01 | 5.07 |
| ස්ථාවර වියදම | 1.99 | 1.88 | 2.10 | 1.83 | 1.84 | 1.85 | 1.80 | 1.97 | 1.92 | 2.05 | 1.90 | 1.98 |
| මෙහෙයුම් ලාභය/ (අලාභය) අතිවිශේෂ අයිතම වලට පෙර | (1.69) | (1.55) | (0.85) | (0.99) | (0.99) | (0.22) | (0.08) | (0.06) | (1.45) | (1.14) | (1.93) | (1.06) |
| මෙහෙයුම් ආන්තිකය % | -33% | -28% | -12% | -17% | -17% | -4% | -1% | -1% | -25% | -18% | -39% | -18% |
| එන්ජින් නඩත්තු ආශ්රිත විශේෂ අයිතම | 0.22 | 0.25 | 3.03 | 0.25 | 0.28 | 0.27 | 0.27 | 0.40 | 0.40 | 0.45 | 0.45 | 0.44 |
| මූල්ය වියදම් | 0.08 | 0.10 | 0.14 | 0.14 | 0.23 | 0.23 | 0.22 | 0.22 | 0.23 | 0.22 | 0.23 | 0.22 |
| මුළු ලාභය/(අලාභය) | (1.98) | (1.89) | (4.02) | (1.38) | (1.49) | (0.72) | (0.57) | (0.68) | (2.07) | (1.81) | (2.61) | (1.72) |
| | | | | | | | | | | | | |
| පොළී, බදු, ක්ෂයවීම් හා කල්බදු වලට පෙර කාර්ය සාධනය | (0.53) | (0.51) | 0.44 | 0.06 | 0.05 | 0.85 | 0.97 | 1.05 | (0.37) | (0.04) | (0.87) | 0.03 |
| EBITDAR ආන්තිකය, % | -10% | -9% | 6% | 1% | 1% | 14% | 15% | 14% | -6% | -1% | -18% | 0% |

**මූලාශ්රය අභ්යන්තර සංඛ්යාලේඛන - මිහින් ලංකා ගුවන් සමාගම**

# නාවික හා ගුවන්සේවා තොරතුරු සහ පර්යේෂණ (පුද්.) සමාගම

**දැක්ම**

"නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍ර වෙත වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම"

**මෙහෙවර**

"නාවික හා ගුවන්සේවා පිළිබඳ තොරතුරු රැස් කිරීම, පර්යේෂණ කිරීම හා පුහුණුව සැපයීම මෙම ක්ෂේත්‍රවල අනාගත දියුණුව හා අභිවෘද්ධිය සැලසීම"

**අරමුණු**

1. නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍ර වලට අදාළ අමාත්‍යවරයා විසින් නියම කරන අවස්ථාවන්හි දී වරාය හා ගුවන් මඟින් සිදු කරන ආනයන අපනයන සම්බන්ධයෙන් දත්ත හා තොරතුරු රැස් කිරීම හා අවශ්‍ය පාර්ශව වෙත ලබා දීම.
2. නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍ර වලට අදාළ අමාත්‍යවරයා විසින් නියම කරන අවස්ථාවන්හි දී වරාය හා ගුවන් මඟින් සිදු කරන භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් දත්ත හා තොරතුරු රැස් කිරීම හා අවශ්‍ය පාර්ශව වෙත ලබා දීම හා එවැනි කටයුතු ප්‍රවර්ධනය සඳහා පවරනු ලබන කාර්යයන් ඉටු කිරීම.
3. ලාභ ලැබීමේ පදනම මත, වරාය හා ගුවන් මඟින් සිදු කරන ආනයන අපනයන පිළිබඳ දත්ත හා තොරතුරු රැස් කිරීම හා බෙදා හැරීම.
4. ලාභ ලැබීමේ පදනම මත, නාවික, වරාය හා ගුවන්සේවා ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා භාර ගැනීම.
5. ආනයන අපනයන හා සම්බන්ධ ක්ෂේත්‍ර සඳහා පුහුණු අධ්‍යාපනය ලබා දීම හා මඟ පෙන්වීම.
6. නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍ර වල ප්‍රවර්ධනයට අදාළ පුහුණු වැඩ සටහන්, දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ හා මානව සම්පත් සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම හා සම්බන්ධීකරණය කිරීම.
7. රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන වල ශාස්ත්‍රීය, වාණිජ්‍ය, වාණිජ්‍ය නොවන හෝ විද්‍යාත්මක ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු හා දත්ත රැස් කිරීම හා බෙදා හැරීම.
8. රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන වල වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක එනම් කෘෂිකාර්මික, අධ්‍යාපනික, මූල්‍ය සේවා, ඉංජිනේරු සේවා, රක්ෂණය හෝ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන හෝ සුභසාධන ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.

**ප්‍රධාන සාධනයන්**

- නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාල ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම හා මඟ පෙන්වීම
- රාජ්‍ය සංවිධානයන්හි වාණිජ්‍ය හා වාණිජ්‍ය නොවන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ හා අධ්‍යයනයන් සිදු කිරීම
- කොළඹ විශ්වවිද්‍යාලය හා එක්ව නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාල දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම
- පෞද්ගලික අංශය සඳහා පර්යේෂණ සිදු කර දීම

**භෞතික ප්‍රගතිය - 2013**

❖ **නාවික, ප්‍රවාහන හා සැපයුම්කරණ කළමනාකරණය පිළිබඳ උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීමට අදාල ව්‍යාපෘතිය**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ නාවික, ගුවන් දැනුම කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ කාර්යයට අප ආයතනයේ දායකත්වය සැපයීමේ අරමුණ ඇතිව මෙම පාඨමාලාව පැවැත්වීමට සැලසුම් කරන ලදී.

**අරමුණු**

විශ්වවිද්‍යාල වරම් නොලත් සිසුන් හට අන්තර්ජාතික වශයෙන් පිළිගත් වෘත්තීයමය සුදුසුකමක් ලබා දීම හා උපාධිය දක්වා අධ්‍යාපනය ලැබීමට මඟ පෙන්වීම.
නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍රවලට අදාළ පුහුණු කිරීම් හා මානව සම්පත් සංවර්ධනය තුලින් කාර්යක්ෂම සේවක පිරිසක් බිහි කිරීමට දායක වීම.

**මෙම වසරේ ප්‍රගතිය**

පුද්ගලික හා රාජ්‍ය අංශයන්හි මෙම ක්ෂේත්‍රයට අදාල රැකියාවල නිරත වූවන් (1000 නියැදියක්) යොදා ගනිමින් සමීක්ෂණයක් සිදුකර ඇත. එම තොරතුරු මත පදනම් වෙමින් ඩිප්ලෝමා පාඨමාලාවෙන් ආරම්භ කර පශ්චාත් උපාධි පාඨමාලාව දක්වා විකාශනය කිරීමට කටයුතු කරනු ලැබේ.

- ➢ පාඨමාලාවට අදාල By- law සකස් කිරීම
- ➢ කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) හා Shippers' Academy සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.
- ➢ පාඨමාලා අන්තර්ගතය හා විෂය නිර්දේශය සකස් කිරීම
- ➢ දේශකවරුන් තෝරා ගැනීම
- ➢ අයදුම්පත් කැඳවීම

## ❖ 2012 / 2016 සංයුක්ත සැලැස්ම සකස් කිරීම

### හැඳින්වීම

සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි 2012 / 2016 වර්ෂ 05 සඳහා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින අනෙකුත් ආයතනයන්හි සියළු විස්තර ඇතුලත් කරමින් සංයුක්ත සැලැස්මක් සකස් කිරීම.

### මෙම වසරේ ප්‍රගතිය

සංයුක්ත සැලැස්ම සකස් කර අවසන් වාර්තාව සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ වෙත භාර දෙන ලදී

## ❖ බුලටීනයක් (Bulletin) සකස් කිරීම

අප ආයතනය තවදුරටත් ප්‍රචලිත කිරීමේ අරමුණින් අප ආයතනයේ සියළු විස්තර ඇතුලත් බුලටීනයක් (Bulletin) සකස් කල අතර එය සියළුම රාජ්‍ය ආයතන වෙත බෙදා හරින ලදී.

### සිදුකෙරමින් පවතින ව්‍යාපෘති

## ❖ මාදු ගඟ තිරසාර ලෙස සංචාරක කර්මාන්තය හරහා සංවර්ධනය කිරීම සඳහා වන පර්යේෂණය (රුහුණු සංචාරක කාර්යාංශය - දකුණු පලාත් සභාව)

### හැඳින්වීම

දකුණු පළාතේ ප්‍රමුඛතම සංචාරක ආකර්ශණීය ස්ථානයක් වන මාදුගඟ, Home-Stay සංචාරක කර්මාන්තය හරහා තිරසාර ලෙස සංවර්ධනය කල යුතු ආකාරය නිරීක්ෂණය කිරීම.

### අරමුණු

සංචාරක නවාතැන් (Home stay) සඳහා වන සැපයුම් දාමය වර්ධනය කිරීමට ප්‍රදේශයේපවතිනමානව හා ස්වභාවික සම්පත් දායක කර ගැනීම

මාදු ගඟ ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ නිවාස සංචාරක නවාතැන් (Home-Stay) ලෙස යොදා ගැනීමට ඇති හැකියාව සොයා බැලීම. මාදු ගඟ ආශ්‍රිතව පවතින ආවේනික නිෂ්පාදන වලට පවතින ඉල්ලුම සහ සැපයුම අතර වෙනස හඳුනා ගැනීම.

**මෙම වසරේ ප්‍රගතිය**

ඉහත ව්‍යාපෘතියට අදාල ව්‍යාපෘති යෝජනාව හා ඇස්තමේන්තුගත අයවැය ඉදිරිපත් කිරීම හා ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් රුහුණු සංචාරක කාර්යාංශය සමඟ සාකච්ඡා කිරීම.

## ❖ ආනයන අපනයන තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම (Data Base)

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට අවශ්‍ය දත්ත ලබා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම.

**මෙම වසරේ ප්‍රගතිය**

ශ්‍රී ලංකා රේගුව සමඟ අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම
පුද්ගලික අංශ සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ අවශ්‍යතාවය සොයා බැලීම
අදාල තොරතුරු ලබා දීමට ශ්‍රී ලංකා රේගුව එකඟ වී ඇත.

## ❖ රාජ්‍ය සංවර්ධන කටයුතු මහජනතාව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ විමසා බැලීමේ සමීක්ෂණය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳ ජනතාව තුල ඇති අවබෝධය සීමා වී ඇති බව බොහෝ අවස්ථාවලදී පෙනී යන කරුණකි. මේ හේතුවෙන් සංවර්ධනයේ නියම ඵල නෙලා ගැනීමට නොහැකි වී ඇත.

**මෙම වසරේ ප්‍රගතිය**

සංවර්ධන ව්‍යාපෘති වලට අදාල පණිවිඩය ජනතාවට සංනිවේදනය වීමට පවත්නා ගැටළු හඳුනාගැනීම මෙහි අරමුණයි.
ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මූලික කටයුතු අවසන් කර ඇති අතර මේ වන විට ප්‍රශ්නාවලියක් මඟින් තොරතුරු රැස් කරමින් පවතී

## ❖ අන්තරායකර රසායන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අත්පොත බෙදා හැරීම.

**හැඳින්වීම**

ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද, කොළඹ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය රොහාන් පෙරේරා මහතා විසින් රචිත අන්තරායකර රසායනික ද්‍රව්‍ය - ආරක්ෂාව හා සුරක්ෂිතභාවය නැමති අත්පොත එම විෂය පිළිබඳ සිංහල බසින් ලියැවී ඇති එකම ග්‍රන්ථය වේ.

**මෙම වසරේ ප්‍රගතිය**

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡාකර දිවයින පුරා ඇති අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) පවත්නා පාසල් සඳහා මෙම අත් පොත බෙදා හැරීමට සැලසුම් කිරීම.

අන්තරායකර රසායනික ද්‍රව්‍ය භාවිතා කරන පාර්ශවයන්ට ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව සැලසීම.

අදාල ක්ෂේත්‍රයේ අධ්‍යාපන කටයුතු වල නිරත වූවන්ට ඒ පිළිබඳ වැඩිදුර හැදෑරීමට.

කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) වෙත පොත් 100 ක් නිකුත් කිරීම.

ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක බලකාය සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම හා අත්පොත බෙදාහැරීමට කටයුතු යොදමින් පවතී.

එමෙන්ම ඉදිරියේදී මෙම අත්පොතට තවත් කොටස් එකතු කිරීමටත් ඉංග්‍රිසි හා දමිළ භාෂා වලට පරිවර්ථනය කිරීමටත් අපේක්ෂා කෙරේ.

## ❖ සිරගතවන්නන්ගේ සංඛ්‍යාත්මක වර්ධනයට හා ඔවුන්ගේ ශ්‍රමය රටේ සංවර්ධන කාර්යයන්ට උපරිමයෙන් ලබාගත හැකි ආකාරය පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම.

**හැඳින්වීම**

ශ්‍රී ලංකාව තුල මේ වන විට බන්ධනාගාර හා පුනරුත්ථාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක බන්ධනාගාර 24 ක් ඇති අතර ඒවායේ පහසුකම් සැලසිය හැකි ප්‍රමාණයටත් වඩා සිරකරුවන් නේවාසිකව සිටින බවට තොරතුරු අණාවරණය වී ඇත. මෙම පිරිස් නඩත්තුව සඳහා රජයට වාර්ෂිකව විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර රටට වටිනා මිනිස් - පැය ප්‍රමාණයක්ද අහිමි වේ.මේ පිළිබඳ අවධානය යොමු කල අප ආයතනය පහත අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය සිදු කරගෙන යනු ලැබේ.

**අරමුණු**

බන්ධනාගාරගතව සිටින රැඳවියන් පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝමූලික වර්ගීකරණයක් සිදු කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හඳුනා ගැනීම.

බන්ධනාගාර පද්ධතියට ඇතුළුවන හා දැනට සිටින සියළුම සිරකරුවන් පිළිබඳ තොරතුරු එක් රැස්කර අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් (Data Base) නිර්මාණය කිරීම.

සිරකරුවන්ගේ හඳුනාගත් හැකියාවන් ප්‍රවර්ධනය කල හැකි වන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා හඳුනා ගැනීම.

රටේ සංවර්ධන කාර්යයන්ට හා නව නිෂ්පාදන ක්‍රියාවලියට සිරකරුවන් යොදාගත හැකි ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම.

මානසික සංවර්ධනය හා නිපුණතා සංවර්ධනය තුලින් සිරකරුවන් පුනරුත්ථාපනය සිදු කල හැකි ඵලදායී ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීම.

ඒ සඳහා සිරකරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල දත්ත පදනමක් නිර්මාණය කිරීම, සිරකරුවන් සම්පූර්ණ වර්ගීකරණකට ලක් කිරීම හා ඔවුන් රටේ සංවර්ධනයට යොදවා ගතහැකි ආකාරය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම. යන කාර්යයන් මෙයට අන්තර්ගත කිරීමට බලාපොරොත්තු වේ.

**මෙම වසරේ ප්‍රගතිය**

සිරකරුවන් දැනුවත් කිරීම සඳහා සකස් කිරීමට නියමිතව තිබූ කෙටි වාර්තාමය චිත්‍රපටය සකස් කර අවසන් කර ඇති අතර සිර කරුවන් දැනුවත් කිරීමෙන් අනතුරුව ප්‍රශ්නාවලියක් මඟින් තොරතුරු රැස් කිරීමට අපේක්ෂා කෙරේ.

- **ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය සඳහා සංයුක්ත සැලැස්ම 2014/2017 (Corporate Plan) සකස් කිරීම**

ජනාධිපති ලේකම් කර්යාලය යටතේ පවතින ආයතනයක් වන ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය සඳහා 2014/2017 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම (Corporate Plan) සකස් කිරීම අප ආයතනයට පවරා ඇත. එය මේ වන විට සකස් කර අවසන් වී ඇති අතර ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය විසින් එය පරීක්ෂා කරමින් පවතී.

- **කොළඹ වරාය හා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සඳහා ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම.**

කොළඹ වරාය, මාගම්පුර මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරාය හා කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හරහා සිදු කරන ආනයන අපනයන වලදී සිදු විය හැකි අනතුරු වලක්වා ගැනීමටත් අනතුරකින් පසු කඩිනමින් සිදු කල යුතු කටයුතු සිදු කිරීම සඳහා ආපදා කළමනාකරණසැලැස්මක් ස්ථාපිත කිරීම. එවැනි සැලැස්මක් පැවතීම ගුවන්තොටුපල හා වරාය සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් වලට අනුකූල වීම සඳහා වැදගත් වේ. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය හා මොරටුව විශ්වවිද්‍යාලය මේ සඳහා සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරයි. වරාය හා ගුවන්තොටුපලින් යහපත් ප්‍රතිචාරයක් ලද විගස මෙම ව්‍යාපෘතිය ආරම්භ කල හැක.

| ආදායම් හා වියදම් මූල්‍ය වාර්තාව<br>(2012.01.01 සිට 2012.12.31 දක්වා) | | |
|---|---|---|
| | රු/ශත | රු/ශත |
| **ආදායම්** | | |
| ස්ථාවර තැන්පතු පොළී | 3,131,840.28 | |
| ශුද්ධ ව්‍යාපෘති ආදායම (සටහන 01) | 490.118.00 | 3,621,958.28 |
| **මුළු ආදායම** | | **3,621,958.28** |
| **වියදම්** | | |
| කාර්යය මණ්ඩල වේතන | 1,434,907.92 | |
| කළමණාකාර මණ්ඩල දීමනා | 806,300.00 | |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 608,000.00 | |
| විගණන කමිටු සාමාජික දීමනා | 27,500.00 | |
| රජයේ හා අමාත්‍යාංශයේ වැඩසටහන් සඳහා පරිත්‍යාග | 250,000.00 | |
| සේවක අර්ථසාධක අරමුදල/සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට ගෙවීම් | 183,902.93 | |
| සන්නිවේදන වියදම් | 121,233.80 | |
| ගොඩනැගිලි කුලී | 554,322.58 | |
| වාහන කුලී | 480,000.00 | |
| ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේ වියදම් | 120,595.90 | |
| සුළු මුදල් වියදම් | 114,067.73 | |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා වියදම් | 46,204.00 | |
| මූල්‍ය වියදම් | 36,027.18 | |
| කාර්යාල නඩත්තු හා වෙනත් වියදම් | 79,115.21 | |
| ගමනාගමන වියදම් | 32,120.00 | |
| **මුළු වියදම්** | | **4,894,297.25** |
| **අතිරික්තය හෝ ඌණතාවය** | | **(1,272,338.97)** |